පළමුවන පරිච්ඡේදය

'' පුතා, ඔයා මොකද කරන්නේ තාත්තගේ පරණ බඩු කාමරේ ? '' කාමරේ දොර අසළ සිට සාරිතා පුංචි පුතා දෙනෙත් ගෙන් ඇසීය ..

'' නෑ අම්මේ , මං මේ පොතක් හොයාගන්න ආවේ '' වයස අවුරුදු දොළහක් පමණ වන පුටුවක් අල්මාරියට හේත්තු කර එය උඩ යමක් සොයන දෙනෙත් පැවසීය .

'' මොකද්ද පොත, කෝ බහින්න මං අරන් දෙන්න..... දූවිල්ලත් ඇති ඔතන'' කියමින් සාරිතා කාමරයට ඇතුලු වන්නට විය. එකවරම පුටුවෙන් පැන ආ දෙනෙත්,

'' නෑ අම්මේ , ඒක මෙතන නෑ '' කියමින් සාරිතාගේ ඇඟේද , හැපෙමින් කාමරයෙන් පිටතට දිව ගියේය .

'' ඔය, බලාගෙන '' කියමින් සාරිතා ද කාමරයෙන් පිටතට ගියාය .

මඳ වේලාවකට පසු තම කාමරයේ සිටි දෙනෙත් ඉතා සෙමින්, මියෙක් අල්ලා ගැනිමට ඉතාමත් ඉවසිලිවන්තව සෙමින් යන පූසෙක් මෙන්, කාමරයෙන් පිටතට පැමිණ හතර අත හොඳින් සෝදිසි කරමින් තමා පෙර සිටි තම පියාගේ බඩු කාමරයට ගියේය .

පසුව තම මව කොහේ හෝ සිටිදැයි යන සැකය ඇතිව යළිත් එම කාමරයේ දොර උලුවස්සෙන් එබී බලන්නට විය .

මඳ වෙලාවක සොදිසියෙන් පසු එහි දොර සෙමින් වසා තමා පෙර නැග සිටි පුටුවටම නැග පෙර සොයමින් සිටි දෙය සෙවිමට පටන් ගත්තේය...

අල්මාරිය මත වූ යමක් ඉතාම යුහුසුලුව දෙනෙත් සෙවීය . එය පරණ බඩු කාමරයක් වූ හෙයින් මදක් අඳුරුය . දුවිල්ල පිරී ගොස්ය . එහි වූ දුවිලි බිඳිති දෙනෙත්ගේ නාසයට යැම නිසා දෙනෙත් හට කිවිසුමක් යෑමට ආවේය . මවට හසුවේවි යන බියෙන් ඔහු තම නාසය හා කට වසා ගෙන ඉතා හෙමින් එය පිට කළේය .

'' ආ මේ තියෙන්නෙ.... මේ එක වෙන්න ඇති...'' යනුවෙන් දෙනෙත් තාමාටම පවසා ගත්තේ අල්මාරිය උඩ වූ පොතක් තම අතේ දාරාගෙනය . එය විවෘත මඳ වෙලාවක් එය සොදිසි කර එයමද කියා තහවුරු කර ගත් ඔහු සීරුවෙන් පුටුවෙන් බැස, කාමරයේ දොර විවෘත කර තමා කාමරයට ආ සැටියටම යුහුසුලුව ඔහුගේ කාමරයට දිව ගියේය .

තම කාමරයේ වූ දොර වසා ගත් ඔහු පරණ රෙදි කැබැල්ලක් ගෙන තම අතෙහි වූ පොත හොඳින් පිස දමන්නට විය .

'' තාත්තා, කියපු විදියට මේක තමයි පොත...ඒත් මේක තාත්තගේ බඩු කාමරේ විසිකරලා දාලානේ තිබ්බේ.... එනිසා දුවිල්ලනේ '' දුවිලි පිසදමමින් සිටින දෙනෙත් තාමාටම මුමුණා ගත්තේය .

පොත හොඳින් පිසදැමූ ඔහු පොත රැගෙන තම ඇඳට පැන්නේ එය කියවීමට මහත් ආශාවකිනි . ඔහු ඇඳට පැන තමා හිස තබන කොට්ටය ඇඳෙහි පත්තට තබා ඒ මතට හේත්තු වී පොත කියවීමට පටන් ගත්තේය .

'' පුතා, පහළට එන්න... දැං රෑට කන වේලාව හරි... ඉක්මන් කරන්න '' කියවීමට සඳහා පොත මුල් පිටුව පෙරලන විටම දෙනෙත්ට කෑම වේලාව ළං වී ඇති බව අවධාරණයට සාරිතා පහළ තට්ටුවේ සිට දෙනෙත්ට ඇසෙන සේ කෑගැසිය .

'' අයියෝ ... කියවන්න හම්බවෙන්නේ නෑනේ අද , '' දෙනෙත් තම ආසාව ඉටු කරගත නොහැකිව දුක්මුසු ලීලාවෙන් තමාටම පවසා ගෙන ,

'' ආ... එනවා අම්මේ '' යනුවෙන් පහල තට්ටුවේ සිටින තම මවට ඇසෙන පරිදි කෑගැසිය .

තම අතෙහි වූ පොත තම පොත් මේසය මත තැබූ දෙනෙත් ආහාර ගෙන ඉන්පසුව පොත කියවන අධිෂ්ඨානයෙන් පහළට ගියේය . තම සීයා හා මව කෑම මේසයේ අසුන්ගෙන බව දුටු ඔහු ද කෑම මේසයේ පසෙක පුටුවක් ඇඳ ඉදගත්තේය . පසුව ගෙදර මෙහෙකාරිය යසෝමා විසින් ඔහුට ආහාර බෙදා දුන්නාය. තම සිත තුල වූ ආශාව නිසා දෙනෙත් තාමාට හැකි ඉක්මනින් ආහාර ගැනිමට උත්සහ කරද්දි ,

'' පුතා ඔයා අද මගෙත් එක්ක නිදාගමුදැයි '' කියා දෙනෙත්ගේ සියා දෙනෙත්ගෙන් ඇසීය .

'' ඔව් තාත්තේ, එයත් ඉතින් තනියමනේ නිදාගන්නේ ... එයා ඒව් . '' කියා දෙනෙත් ගේ මව පවසද්දි දෙනෙත්ගේ මුහුණ වැසි වලාකුලක් සේ බරව ගියේය . මන්ද තම පියාගේ දිනපොත කියවීමට දෙනෙත් තුල වූ ආශාව මුදුන් පමුණුවා ගැනිමට නොහැකිව වීම නිසාය . ඔහුට හෙට උදෑසනම පාසල් යාමටද සිදුවේ . මන්ද යත් හෙට පාසල් පලමු වාරය අවසාන වන නිසාය.

'' පුතා කෑම කන්නේ නැද්ද? '' සාරිතා දෙනෙත්ගෙන් ඇසීය. නමුත් කල්පනා ලෝකයක අතරමං වූ දෙනෙත්ට එය ඇසුනේ නැත .

'' පුතා, '' යළිත් වරක් සාරිතා තම හඬ උස් කර ඇසීය .

ගැස්සී ගිය දෙනෙත් ,

'' කනවා අම්මේ '' යනුවෙන් පවසා යළි තම යථා ලෝකයෙහි වූ පියව් සිහියෙන් ආහාර ගැනිමට පටන් ගත්තේය .ආහාර ගෙන අවසන් වූ පසු තිදෙනාම කෑම මේසයෙන් නැගිට රාත්‍රි වැඩසටහන් නැරඹීමට රූපවාහිනිය අසලට ගියෝය.

'' අන්තර්ජාතික ලීග් තරගාවලිය මේ වසරෙ නොපැවැත්වීමට ඉන්දියානු ක්‍රිකට් බලධාරීන් පියවර ගෙන ඇත . මන්ද යත් ඉන්දියාව පුරා මෙ දිනවල විෂ වායුවක් පැතිරි යාම නිසාය .'' යනුවෙන් විශේෂ පුවතක් රූපවාහිනියේ විකාශය වන්නට විය .

තිදෙනාම එකවරම හුස්මක් ගෙන එය පිට කර ,

'' අපරාදේ '' යනුවෙන් පැවසීය . කාලය කෙමෙන් ගෙවී යන්නට විය .

'' පුතා එහෙනම් අපි යමු නිදාගන්න. හෙට ඉස්කොලේ යන්නත් ඕනේනෙ... '' කියා තම අසුනෙන් නැගිටිමින් දෙනෙත්ගේ සීයා දෙනෙත්ට කීය .

'' ආ, ඔව් පුතා දැං යන්න .'' සාරිතාද දෙනෙත්ට කීය .

'' පුතා එහෙනම් අපි යමු නිදාගන්න. හෙට ඉස්කොලේ යන්නත් ඕනේනෙ... '' කියා තම අසුනෙන් නැගිටිමින් දෙනෙත්ගේ සීයා දෙනෙත්ට කීය .

'' ආ, ඔව් පුතා දැං යන්න .'' සාරිතාද දෙනෙත්ට කීවාය .

'' හා යමු සීයේ ...'' යනුවෙන් , දෙනෙත් ද තම ආශාව යටපත් කරගෙන සීයා හා නින්දට එක්වුයේ හෙට්න් පසු පාසල් නිමව් තමාට පොත කියවීමට ඕනෑ තරම් කාලය ඇතැයි යන අරමුණිනි .

'' එහෙනං යමු පුතේ... '' කියා සියා දෙනෙත්ගේ හිස අතගැවේය . දෙනෙත් ද පුටුවෙන් නැගිට තම මවට සුභ රාත්‍රියක් පතා සීයා හා නින්දට යාමට ඔහු හා උඩුමහලට ගියේය .

මධ්‍යම රාත්‍රි 12 පමණ වන තුරුම දෙනෙත් ට නින්ද ගියේ නැත . මන්ද ඔහු සිටින්නේ මහත් කුතුහලයකිනි . ඔහු මෙතෙක් කිහිපවරක්ම ඇදෙන් බිමට බැස තම කාමරය කරා යැමට උත්සහ කල ද රාත්‍රි අඳුර නිසා ඔහුගේ සිත තුල බියක් පැන නැගින එහෙයින් තම සිත තුල වු කුතුහලය තුලම ඔහු නින්දට වැටුනේ පසුදා උදෑසනම පාසැල් යාමට වන බවද සිහි තබා ගෙනය .

'' ටික්, ටොක්, ටික්, ටොක් '' යනුවෙන් කාමරයේ බිත්ති ඔරලොසුව නාද වීමත් සමග අවදි වු සාරිතා වහාම මෙහෙකාරියවද ඇහැරවිය . එසේම තම පියාගේ කාමරයට ගොස් පියාවද පුංචි පුතා දෙනෙත්වද ඇහැරවිය .

'' පුතා නැගිටින්න .... නැගිටින්න ඉස්කෝලේ යන්න පරක්කු වෙනවා '' සාරිතා දෙනෙත්ව සොළවමින් නැගිට වීමට වෙර දැරිය .

අවසානයේ ඇය දෙනෙත්ව තම කරට ගෙන නාන කාමරය දක්වාම ඔසවා ගෙන ගියාය . ඉන් පසුව නාන කාමරයේ වතුර බේසම මත ඔහුව හිඳවීය .

වතුර තම ශරීරයේ ගැටීම නිසා පුංචි පුතා දෙනෙත් , සාරිතා දුන් බෙහෙත් තැවරූ බුරුසුවෙන් දත් මැද නා පිරිසිදු වී , ඇඳුම් ඇගලා පාසල් යාමට සූදානම් වීය . ඒ අතරතුර මෙහෙකාරියගේ උදවී මත සාරිතා දෙනෙත් හට උදේ ආහාරය සූදානම් කර කෑම පෙට්ටියද, වතුර බෝතලයද දමා යුහුසුලුව පාසල් බෑගය සූදානම් කරමින්ම දෙනෙත් හට උදෑසන කිරි විදුරුව හා චීස් කැබැල්ල ආහාරට ගන්න කියා පැවසුවාය .

දෙනෙත් ද පාසල් ඇඳුමින් සැරසි තම කිරි විදුරුව හා චීස් කැබැල්ල ආහාරයට ගෙන අවසාන කළේය .

'' වාහනය ගන්න, පරක්කු වෙනවා '' යනුවෙන් සාරිතා ඩ්‍රයිවර්ට කීය . ඒ සමග ම කාරය ගේට්ටුව අසලට ගත් ඩ්‍රයිවර්

'' හරි නෝනා යමු '' කීයා ඔහු පිළිතුරු දුන්නේය .

තම එක් අතකින් දෙනෙත් ගේ පාසල් බෑගයද අනෙක් අතින් දෙනෙත් ගේ අතද අල්ලා ගත් සාරිතා දෙනෙත් සමග කාරය අසලට ගොස් කාරයේ දොර විවෘත කර දෙනෙත්ව කාරයට නග්ගවා බෑගය අනෙක් ආසනයෙන් තැබුවාය .

පසුව දෙනෙත් අමතා, '' පුතා පරිස්සමින් , අද වැඩ ටික හොඳට කරගන්න '' යනුවෙන් පැවසූ සාරිතාට දෙනෙත් හිස වනමින් පිළිතුරු දුන්නේය .

ඉන්පසු සාරිතා කාරයේ දොර වසා ඩ්‍රයිවර්ට , '' පරිස්සමින් යන්න '' කියා කීවාය .

කාරය නිවසින් පිටත් වන තුරුම ඒ දෙස බලා සිටි සාරිතා පසුව ගෙට ගොස් තම නිවස තුළ වූ වැඩසටහන අරම්භ කළාය. එනම් දිනපතා සිදුකරන ගෙදර දොරේ වැඩ කටයුතුය .

දෙනෙත් පාසල් ගියාට ඔහුගේ සිත ඇත්තේ නිවසේය . ඔහුට පාසල නිමා වන තුරු ඇත්තේ මහත් නොඉවසිල්ලකි . වරින් වර ඔහු පන්ති කාමරයේ ඔරලොසුව දෙස බලා සුසුම් හෙලයි .

බොහෝ වේලාවකට පසු දෙනෙත් බලා සිටි ඒ මොහොත පැමිණියේය . පාසලේ අවසාන සීනුව නාද විය .

'' දරුවනේ, ඔබගේ පළමු වන පාසල් වාරය අදින් අවසන් . ක්‍රීඩාවටම යොමු නොවී ඔබගේ අධ්‍යාපන කටයුතු වලටත් මේ නිවාඩුව තුළ ඉඩ ලබා දෙන්න ඔබ සැමට සුභ නිවාඩුවක් '' විදුහල්පතිතුමා ශබ්ද විකාශනයෙන් ඒ නිකුත් කළේ පලමු වාරයේ අවසන් නිවේදනයයි .

දෙනෙත්ගේ මුහුණේ මතු වූයේ සිහින් සිනහවකි . ඒ සමගම බෑගය කරට දමා ගත් ඔහු වහාම පාසලෙන් පිටවීමට ඇති ගේට්ටුව කරා දිව ගියේ තමා ගෙදර ගෙන යාමට කාරය පැමිණ ඇත්දැයි බැලීමටය . ඈත දිම කාරය දුටු දෙනෙත් ඒ කරා , ගෙන යාමට පැමිණි ඩ්‍රයිවර්ගේ අසලට දිව ගියේය . දෙනෙත් එනු දුටු ඩ්‍රයිවර් කාරයේ දොර විවෘත කළේය .

වහාම කාරයට නැගි දෙනෙත් '' යමු , යමු '' කියා යුහුසුලුව ඩ්‍රයිවර්ට කීවේය .

දෙනෙත්ගේ වෙනදා නැති උනන්දුව පිළිබඳව ඩ්‍රයිවර්ට පුදුම සිතුනේය . නගරයේ වු සුපිරි වෙළඳසැලක් වු කේප්සි ගොස් චොක්ලට් අයිස්ක්‍රිම් එකක් දිනපතා කෑම දෙනෙත්ගේ පුරුද්ද විය . ඒ නිසා එදිනද ඩ්‍රයිවර් අයිස්ක්‍රිම් ගැනිමට කාරය හරවා නැවැත්විමට සුදානම් විය .

'' නැ, නැ අද අයිස්ක්‍රිම් ඕන නෑ .... අපි ගෙදර යමු '' කියා දෙනෙත් පැවසීය . ඩ්‍රයිවර් සිතා ගත නොහැකි විය . ඔහු නැවත කාරය හරවා නැවත නිවස බලා ධාවනය කරන්න පටන් ගත්තේය .

නිවසේ ගේට්ටුව අසලට පැමිණ කාරයේ නලාව නාද කරනවාත් සමගම වැඩ කරන අයෙක් පැමිණ එය විවෘත කළේය . කාරය වත්තට දැමු ඩ්‍රයිවර් , දෙනෙත්ට කාරයෙන් බැස යාමට කාරයේ දොර විවෘත කරනවාත් සමගම දෙනෙත් වේගයෙන් නිවස තුළට දිව ගියේය .

දෙවන පරිච්ඡේදය

නිවස තුළට දිව ආ දෙනෙත් තම කාමරයට ගොස් ඇඳුම් මාරු කර දිවා ආහාරය ගැනීමට පහළට ආවේය . දිවා ආහාරයෙන් වෙනදා නම් ඔහු කරන්නේ අතුරුපසත් රැගෙන රූපවාහිනියට වාඩි වීමයි . නමුත් අද ඔහු කළේ අතුරුපසත් රැගෙන කාමරයට යාමයි . තම කාමරයට ගොස් දොර වසා ගත් ඔහු තම පොත් මේසය මත වූ පොතක් ද රැගෙන ඇඳට පැන්නේය . පොත නම් පෙරදින රෑ ඔහු තාත්තාගේ පරණ බඩු කාමරයෙන් ගෙන ආ පොතයි . ඉක්මනින් අතුරුපස කා දැමූ ඔහු ඇඳ පත්තට කොට්ටය තබා ඒ මත හේත්තු වී පොත කියවීමට සූදානම් විය .

මම සයුර , අම්මා දිපු නම සයුර වුනාට යාලුවෝ දිපු නම '' පේලේ '' . ඉතින් ගොඩක් අය මට කිව්වේ පේලේ කියලා තමයි . මට ඉන්නේ අම්මයි , සීයයි විතරයි . මට දැං අවුරුදු 17 ක් . මේ මගේ දිනපොත . හැමදාම හවසට දවසේ වුනු දෙවල් මේ විදියට මේකේ ලියන එක තමයි මගේ පුරුද්ද .

මට ඉන්නවා සෙට් එකක් . ඒ කියන්නේ මගේ සෙට් එක . යාලුවෝ හයයි . ඒක තමා මගේ පවුල . මගේ අම්මා , ඒ කියන්නේ මගේ දෙව්යෝ . ඇය මං නිසා ගොඩක් දුක් විඳින අයෙකි . ගමේ රහම කෑම කඩේ එයාගේ තමා . එතකොට සීයා..... ටිකක් විතර වයසයි . නෑ එයාට දැං අවුරුදු අසූවක් . හැබැයි තාම ඉලන්දාරියා වගේ . සීයා පියර දාලා ලස්සනට ඇදලා සුවදට ඉන්න හරි ආසයි .

මං සාමාන්‍ය පෙළ ලියා අවසන් . දැං ගෙදරට වෙලා ඉන්නේ ප්‍රතිඵල එනකං . මගේ සෙට් එකත් එක්ක ගම වටේම ගිහින් කරක් ගහලා ඉර බහින්න කලින් කොහේ හිටියත් ගෙදරට ඇවිත් තමයි මේ මාස තුන ගෙවන්නේ .

අදත් ඒ වගේ දවසක් , අම්මා හදපු කෑම ටික උදෙන්ම කඩේට ගෙනියන්න උදව් කරලා , ඊටපස්සේ සෙට් එකත් එක්ක තමා පිව්තේ . '' පුතේ ඔය කඩේ ලෑල්ල අරින්න .'' අම්මා සැම උදයකම මට මෙසේ පවසන්නීය .

'' හරි අම්මේ අරින්නං, '' අපේ කඩේ කවුලුවට හේත්තු කරලා තින්නේ ලෑල්ලක් , හැමදාම මං තමා ඒක අයින් කරන්නේ .

'' ආ , මල්ලි පුතා , වැඩ වගේනේ ... '' ඒ ජබ්බා .

ඒ කියන්නේ ජනිත් . මගේ හොදම යාලුවා . කැරලි කොණ්ඩේ , ඉස්සරහට ආපු බඩගෙඩිය . ඒ නිසයි ජබ්බා කියන්නේ .

'' වරෙන් , වරෙන් අපිත් උදව් කරමු ... '' තරියා අනිත් උන්ට කිවේය .

තරියා කියන්නේ තරිදු . අනිත් එකා . උසයි කෙට්ටුයි . හැබැයි ඕන වේලාවක කනවා .

'' හා , හා මේ මං කුඹුරු කොටන්නෑ , ලෑල්ල අයින් කරනවා උඹලා හිටපන් ඔතනම '' ලෑල්ල අයින් කරන ගමන්ම මං උන්ට එහෙම කිව්වේ හැමදාම උන් ඔහොම එනවා කියලා දන්න නිසාමයි .

'' ආ දැං මොකද මේ පැත්තේ '' ලෑල්ල පසෙක තැබූ මම විමසුවේය .

'' නෑ මේ , අපි උබව බලන්න නේම් ආවේ ''ඒ තමා නේව්යා . නෙවින්ද .

'' ඔව් අපි ආවේ ඇන්ටිව බලලා යන්න '' චරියා එසේ කිවේය. චරියා කියන්නේ චරිත් .

උන් ඔහොම කියාගෙනම යනවා කඩේ ඇතුළටම . ගිහින් ඔක්කෝමත් එක්ක ,

'' ආ , අනෝමා අම්මා '' කියාගෙන බඩවල් ටික අතගානවා . ඉතින් එතකොට අම්මා පරිප්පු හොදියි පරාටයි මේසේට තියලා ඇති වෙනකං කන්න කියනවා . බාගයක් කාලා ඉවර වෙද්දි කොහේ හරි ඉදලා දනියත් දුවගෙන ඇවිත් එකට සෙට් වෙනවා .

දනියා කියන්නේ දනිදු . අපේ සෙට් එකේ උදේ වරුව හැමදාම ගෙවෙන්නේ අපේ කෑම කඩේ තමා ... පස්සේ ඉතින් එතනින් නැගිටලා ගම වටේම යනවා . ඔහොම තමයි පිවිතේ .

'' ඔව් මේ අවස්ථාවේ අපිට දැකගන්න පුලුවන් සයුර පන්දුව යැවීමට සුදානම් වෙනවා , ඔව් ඔහු පන්දුව අතේ දරාගෙන විකට්ටුව දෙස බලනවා . ඔහු දැං දිව යනවා . ප්යග්‍රහණයට අවශ්‍යව ඇත්තේ තව ලකුණු හයක් පමණයි . ඉතිරිව ඇත්තේ අවසාන කඩුල්ලයි . තරගය ඉතා උණුසුම් . ඔව් සයුර පන්දුව එල්ල කරනවා . රන්සර පිතිකරුවා අන්දමන්ද කරමින් පන්දුව කඩුල්ල දෙකඩ කරනවා . ඒ අනුව සයුර ප්‍රමුඛ , කිංග්ස් ලෙවන් ප්යගන්නවා ඇඹරුල්ලා කොටුවකට ඇඹරුල්ලා ගෙඩියක් ගසා ගෙන එය මයික් එකක් ලෙස තබා ගෙන සිටින ප්බ්බා තරග නිවේදක මෙන් සැමදාම තරගය විස්තර කරයි .

ප්බ්බාගේ හීනයද තරග නිවේදකයෙකු වීමයි .

'' මං නං හිතුවා බං අද පරදියි කියලා '' තරියා මට කිවේය .

'' උන් කොහොම දිනන්නද බං සයුරයා ඉන්නකං , මූනේ අපේ පෙලේ '' දනියා මගේ බෙල්ල බදා ගෙන එසේ කිවේය .

තම පිරිස සමග ආවේගයෙන් හැසිරුණු ජෙහාන් , '' ෂික් , අදත් පරාදයි අර සයුරයට... හැමදාම ඔහොමයි...'' බැට් එක පොළවේ ගැසූ ජෙහාන් ලෙස කිවේය .

ජෙහාන් යනු ගමේ ග්‍රාමසේවකගේ පුතාය. කුඩා කළ සිටම ඔහු මා හා ආවේගයෙන් සිටි . ගමේ මදක් ඉහළ පවුල් වල ඉලන්දාරීන් ඔහු ඇසුරු කළේය .

'' නැ බං එක පාරටම බෝලේ ආවා . ඒකයි වුනේ '' ජෙහාන්ගේ කර අල්ලමින් රන්සර කියද්දී , ජෙහාන් ඔහුව බිමට තල්ලු කළේය .

පසුව මෙසේ කිය, '' පල , පල හැමදාම ඔහොමයි . ''

රන්සර බිම ඇද වැටිනි . රන්සර යනු ජෙහාන්ගේ පිලේ අයෙකි . මගේ අම්මා කඩය කුලියට අරන් තීන්නේ රන්සරලාගෙන්ය . රන්සර එකවරම බිම වැටුණු නිසා අපිත් එතනට දිව ගියෙමු .

'' ඇයි උඹලා ආවේ දැන් ''

ජෙහාන් ආවේගයෙන් මා වෙත ඇගිල්ල දිගු කර අපෙන් ඇසීය.

'' යකෝ මූ වැටුනේ ඇයි කියලා බලන්නයි ආවේ . උඹේ කේන්තිය අඩුකරගනින් බං මොකද සල්ලි වලට ගහන මැච් නෙමෙයි නේ මේවා . '' දනිදු කිවේ ජෙහාන්ටය .

'' හරි ඌ අපේ එකෙක් . වැටුනා නං අපි බලාගන්නං . උබලා ආවේ උස්සන්නද? '' ජෙහාන් දනිදුගේ ඔලුවට ගසා කිවේය .

'' උස්සන්න බැරි කමකුත් නැ . හැබැයි උඹට ගහන්න හේතුවක් නැ, දනියට හොදේ '' තරිදු ජෙහාන්ට ඇගිල්ල දිගුකර කීවේ මදක් ආවේගයෙනි .

'' උඹ , හිගන්නා... මුන්ව එක්කන් පලයං, අනාථයා '' ජෙහාන් මා දෙස බලා කියා ,

'' නැත්තම් මුං අද අපෙන් කනවා රෑ කෑම ''

'' කවිද යකෝ හිගන්නා , අනාථයා කියන්නේ කාටද උඹ ආ .. '' නෙවින්ද ඉදිරියට ගොස් ජෙහාන්ගෙන් ඇසීය .

'' උඹලා අපිට ගහන්නද ? ආ '' ජබ්බා ද ජෙහාන්ගෙන් ඇසීය .

'' ඇයි උඹලා ලොකුද ? පල ඇම්බැට්ටයෝ යන්න. '' ජෙහාන් අසල සිටි උදාර කිවේය .

'' අනේ බං අපි ලොකුත් නෑ, පොඩිත් නෑ, උඹලා කියන්න ඕනෙත් නෑ අපිට යන්න '' ජබ්බා විහිලුවට මෙන් කීය .

'' අද උඹට මං.. '' කියමින් දසුන් ජනිත් ට පහරක් ගැසුවේය .

'' යකෝ අපේ එකාට ගහන්න උඹ කවුද ? '' කියා කරිදු ජෙහාන් අසල සිට දසුන්ට පහරක් ගැසීය.

'' රණ්ඩුව මෙතනින් ඉවර වෙන්නේ නෑ . මගේ අයව නවත්තන්න ඕනා '' යැයි යන අදහසින් මං කරිදුව නැවැත්වීය .

'' යමු බං, අපි මං වගේ වෙන්නේ මොකටද අපි ? '' මම මගේ අයගෙන් කීවෙම් .

'' නෑ බං සයුර මුං, '' තරිදු මා හට එසේ කියාගෙන එද්දි , මා ඔහුට '' ඇති බං, දැං යං. මං කියනවට '' මෙසේ කිවේම් .

'' හරි උඹලා මතක තියාගනිල්ලා අද උඹලා බේරුනේ සයුර කියපු නිසා හරිද ? '' ජනිත් ජෙහාන්ට කිවේය .

'' හරි උඹලා හරි ලොකුයිනේ , ඔය අනාථයා කියන දේ අහපන් '' උදාර කිවේය . එවිට ජෙහාන් , උදාර ඇතුලු ඔහුන්ගේ යහලුවන් සිනා සිය .

'' දැං යං බං , '' කියා මම ගෙවල් දිහාවට යන පාරට හැරුනේමි . මගේ කිම නිසා මගේ මිතුරන්ද මා හා ආහ .

නමුත් ෂෙහාන්ලා , '' හූ අනාථයා , '' කියමින් අපට ඇසෙන සේ කෑගැසිය . ඒවා නොඇසුනු ගානට අපි ආවේමු .

වෙනදා නං ක්‍රිකට් ගැසිමෙන් අනතුරුව අප යන්නේ ගගේ නෑමටය . නමුත් අද එසේ කිරීමට නොහැක . අද රෑ බෝව් වැඩිය . ඒ නිසා අපි කෙළින්ම අපේ කඩයට ගියෙමු . ඒ හැලප සමග තේ පානය කිරීමටය .

ඈත සිටම අප එනු දුටු මව මේසයට තේ කොප්ප හයක් සමග හැලප දහයක් තැබිය . එවායින් සප්පායම් වුනු අපි එතැනින් නැගිට්ටෙමු .

'' එහෙනං ආයේ හෙට '' කියා අප වෙන් වුනෙමු .

මම කඩේ අසළ නැවතුනේ වෙනදා මෙන්ම කඩේ වැසු පසු ගෙදර යාමටය . මද වේලාවකට පසු අම්මා සමග ගෙදර ගියෙමි . ඇග පත සෝදා ගෙන අද කෙළින්ම ඇඳට වැටුනෙමි .

ටික වේලාවකට පසු අම්මා කාමරයට ආවාය . '' කෝ අද ටිවි බලන්නේ නැද්ද ? දැන්මම ඇඳට ඇවිත් තියෙන්නේ '' හිස අතගාමින් අම්මා ඇසුවාය .

'' නැ අම්මේ , අද ඕන නැ . '' මම පිළිතුරු දුන්නේමි .

'' ඒ මොකෝ ඒ '' මව යළිත් ඇසුවාය .

'' අද මට හරි නැ අම්මේ '' මම කිවේමි .

'' ඇයි පුතේ කවුරු හරි මොනවා හරි කිව්වද මගේ පුතාට '' මව ඇසුවාය .

'' අර ජෙහාන්ලා අදත් රණ්ඩුවට ආවනේ අම්මේ.... '' මම අම්මාට කිවේමි .

එවිට අම්මා අහිංසක ලෙස , '' අනේ ඇයි පුතේ ඒ '' මගෙන් ඇසීය .

'' අම්මේ ක්‍රිකට් ගැහුවා එයාලා පැරදුනා '' මම කිවේමි .

'' ඉතින් ඔයා රණ්ඩුවට ගියේ නෑනේ පුතේ '' අම්මා මගෙන් ඇසුවාය .

'' මං නිසයි රණ්ඩුව නතර වුනේ '' මම අම්මා කිවේමි .

'' මගේ හොඳ පුතා , අපිට බැ පුතේ ඔය ලොකු ලොක්කොත් එක්ක හැප්පෙන්න . එයා ග්‍රාමසේවකගේ පුතානේ , අපි අපේ පාඩුවේ ඉමු පුතේ '' කියමින් අම්මා මගේ හිස පිරිමැද්දාය .

'' ඒත් අම්මේ එයාලා මට අනාථයා කිව්වනේ '' දුක්මුසු මුහුණින් අම්මාට කිවේමි .

එවිට කාමරයේ දොර අසළ සිටි සීයා ,

'' උඹට නිකන් නෙමෙයි ගෙදර එන්න තිබ්බේ පුතේ, ඔය වචනේට '' ඔහු කිවේය .

'' අනේ තාත්තේ, මොනාද මේ පොඩි ළමයට කියන්නේ ? '' මව සීයාගෙන් ඇසීය . ඒ අසා මා දෙස බලා '' මගේ පුතා ඕවා ගණන් ගන්න එපා . පුතා අනාථ නෑ ... මායි සීයයි ඉන්නවනේ පුතාට '' කිවාය .

'' පුතේ උඹට අනාථයා කියපු එකාට ගැහුවේ නැත්තේ ඔයටද ? මොකද උඹේ අම්මා කියන විදියට උන් ලොකු මිනිස්සුනේ '' සීයා මගෙන් ඇසුවේය .

'' අනේ නෑ සීයේ , උන්ට ගහලා උන්ගේ තත්ත්වෙට මං වැටෙන්න ඕන නැති නිසයි එහෙම කරේ '' මම සීයාට පිළිතුරු දුන්නේමි .

'' උඹ උසස් පුතේ , උඹ උසස් .. '' සීයා මට කිවේය .

'' හා දැං යමු කෑම කන්න '' අම්මා මටද සීයාටද කීවාය . රෑ කෑමෙන් අනතුරුව ටිවි බලා නින්දට ගියෙමි .

'' පුතා දෙනෙත් .. මොකද කරන්නේ කාමරේට වෙලා '' සාරිතා පහළ සිට දෙනෙත්ගෙන් ඇසීය .

'' අම්මේ මේ මං ස්කෝලෙන් පොතක් ගෙනවා ඒක කියවනවා '' තරප්පු පෙළ ලගට පැමිණි දෙනෙත් මවට පිළිතුරු දුන්නේය .

'' හා , හොදයි පුතේ . මං බැලුවේ මේ කිසි සද්දයක් නැති නිසා '' අම්මා පැවසීය .

දෙනෙත් නැවත පොත කියවීමට පටන් ගත්තේය .

තුන්වන පරිච්ඡේදය

'' ටික්, ටොක්, ටික් '' ඔරලොසුව නාද වන්නට විය . මම එය නවත්වා ඇඳෙන් බැස්සෙමි. අම්මා මුලුතැන්ගෙයි ඇති බව මා හඳුනා ගත්තේ මුලුතැන්ගෙයි සිට පැමිණි සුවඳිනි . මම ඇනුම් අරිමින්ම මුලුතැන්ගෙට ගියෙමි . ඒ හැකි උපකාරයක් කිරීමටය. මා යන විටත් ඇ සියලු වැඩ කර හමාරය . මන්ද වේලාව උදැසන හයයි තිහ පමණ වී ඇති නිසාය .

'' පුතේ මේ කිරි එක බීලා බත් ටික කාලා කඩේට යන්න ලෑස්ති වෙලා එන්න . '' ඇය කෑම බාස්කට් වලට දමන අතර මට කීවාය .

'' හා අම්මේ , මං එන්නං '' කියා මම ළිඳ ලගට ගියෙමි . පසුව ඇග පත සෝදා අම්මා හා කඩයට ගියෙමි . වෙනදා මෙන්ම අදත් කඩේ ලෑල්ල ඉවත් කර, අම්මා කඩේ පහන පත්තු කරන ආකාරය බලා වුන්නෙමි .

'' අඩෝ පේලේ '' ඒ ජබ්බාය .

'' මං ඒත් බැලුවා අද උඹලා පරක්කු ඇයි කියලා '' මම විහිලුවට මෙන් කීමි .

'' මේකයි සහෝදරයා පරක්කු වෙලා හැමදාම උදේම අනෝමා ඇන්ටිව බලලයි අපි වැඩ පටන් ගන්නේ . හවසට එයාව බලලයි අපි ඇදට යන්නේ ... නැද්ද බං ... '' ජබ්බා අනිත් උන්ගෙන් ඇසීය .

'' නැත්තං , නැත්තං '' තරීදු පිළිතුරු දුන්නේය .

'' ආ ... උඹලා අපේ අම්මට ගොඩක් ආදරෙයි නේ... '' මම විහිලුවට මෙන් කිවේම් .

'' ඔව් සහෝදරයා අනෝමා ඇන්ටි අපිට ආදරෙයි . අපි ඇන්ටිට ආදරෙයි . ඒ හැගිම සල්ලි වලට ගන්න බැ කොල්ලෝ '' ජබ්බා කිවේය .

'' ආ , ආ ගගග උඹගේ පොර ටොක්ස් නවත්තගනින් '' මම ජනිත්ට කියන විට ,

අම්මා , '' පුතාලා අද මොනාද කන්නේ .. ලැවරියා තියෙනවා , සීනිසම්බල් පාන් තියෙනවා , බත් තීනවා යනුවෙන් පැවසීය .

'' අම්මේ ඔය ඔක්කෝම දුන්නත් කමක් නෑ . පුතා කනවා '' ජබ්බා පැවසීය .

'' යකෝ මූ '' මං ජබ්බාගේ දෙස බලා පවසන විට සියල්ලෝම සිනා සෙන්නට විය .

'' ආ කාලා ඉන්න ළමයි '' යනුවෙන් පවසමින් අම්මා කෑම මේසයට කෑම තැබුවාය .

'' ආ අම්මේ මේ එනෝ '' කියමින් ජබ්බා මුලින්ම ගොස් මේසයේ පුටුවක් ඇද වාඩි විය . පසුව අපිද එහි ගියෙමු .

සියල්ලෝම කෑම කන අතර ජබ්බා වේගයෙන් කනු දුටු නේවින්ද ,

'' යකෝ හිමිහිට කාපන් හිරවෙයි '' යනුවෙන් විහිලු කළේය .

'' කාපල්ලා , කාපල්ලා අද විතරයි කන්න වෙන්නේ . හෙට ඉදන් ඉවරයි . '' කෑම කටේ තබා ගෙනම ජබ්බා කිවේය .

'' ඇයි බං ඒ '' තරියා ඇසිය .

'' අන්න ටිවි එකේ දැම්මා අද දවල් දොළහට විභාග ප්‍රතිඵල එනවා කියලා '' ජබ්බා කිවේය .

'' අනේ බං මට හිරවුනාද කොහේද .... පිටට ගහපන් '' දනියා මට කීය . ඔහුගේ පිට අත ගා බිමට වතුර විදුරුවක් ගෙන දුන් මම ,

'' ඇත්තටමද බං'' යනුවෙන් ජබ්බාගෙන් ඇසීය .

'' මං මොකටද බං බොරු කියන්නේ , යකෝ අරූට දාඩියත් දාලා ... '' චරියා දෙස බලමින් ජබ්බා කිවේය .

'' දාඩිය නෙමෙයි බං , මුත්‍රා යන්න වගේ දැන්නම් '' චරියා කිවේය .

''ඔව් බං , සයුරට නම් බය වෙන්න දෙයක් නෑ. මූට A9 නේ .. ඒත් අපි '' තරිඳු හිස කසමින් කීය .

'' අනේ පලයන් බං යන්න , උබත් පාස් ඇති... ඒත් මං.. අහෝ මාගේ සිහිනය '' ජබ්බා සිනාසෙමින් පැවසීය

'' හරි , එහෙනං අපි යන්ද? '' මම ඔහුන්ගෙන් ඇසිම් .

'' දැන් වෙලාව අටහමාරයි '' මම කිම් .

''කොහේ යන්නද බං , මං බය වෙලා ඉන්නේ '' චරියා කීවේය .

'' අද පොඩි හාමුදුරුවෝ ඒ පැත්තේ එන්න කිව්වා . අනික පන්සලට ගියොත් ලෞකු හාමුදුරුවන්ගේ ෆෝන් එකෙන් අපිට ප්‍රතිඵල බලන්නත් පුලුවන්නේ '' මම කීවෙම් .

'' එකෙන් බලන්න... අපෝ ලොකු හාමුදුරුවොත් දකියි එතකොට.. ඒ නිසා මගේ ඒකෙන්ම බලමු '' නේව්න්ද කීවේය .

'' හරි උබේ එකෙන් බලමු . පන්සලට දැං යං පොඩි හාමුදුරුවෝ එන්න කිව්වනේ . හීන් ආතා අතේ උදේ කඩේට පනිවුඩෙ එව්වේ '' මම කීවෙම් .

'' හා එහෙනම් යමු ... '' යනුවෙන් චරියා පැවසීය . සියල්ලෝම වතුර බී තම පුටු වලින් නැගිටිටෝය .

අපි පන්සල බලා පිටත්වුනෙමු .

ඒ යන අතරතුර, අපිට ෂෙහාන් ඇතුලු ඔවුන්ගේ මිතුරන් පිරිස මුණගැසුනෙමු .

'' අපෝ උදේ පාන්දරම මුන් ටික, අද දවසම ඉවරයි'' උදාර ෂෙහාන්ට අපට ඇසෙන සේ කීවේය.

'' තුක් නොදකින් '' උගුර කාරා කෙළ ගැසු රන්සර විහිලුවට සිනාසීය .

'' බලපන් තරියා, අරුන් කරන ඒවා '' නෙවින්ද තරිදුට මිමිණුවේය .

''නෙවියා අපි යන්නේ කොහාටද '' මම නෙවින්දගෙන් ඇසිමි .

'' පන්සලටනේ බං'' ඌ මට පිළිතුරු දුන්නේය .

'' එහෙනං අනිත් වුන්ගේ කතා අපිට අදාළ වෙන්නේ නෑ නේද , නෑහුන ගානට යමු'' මම ඔහුට කීවේමි .

අපි සයදෙනා ඔවුන්ගේ කතා නැහුන ගානට එතනින් පිටව් පන්සල බලා අවෙමු.

හීන් ආතා එවිට බෝධිය වටා අතුගාමින් ඉන්නට විය .

අපිව දුටු ඔහු '' ආ ඉලන්දරියෝ ටික ආවද ? අන්න පොඩි හාමුදුරුවෝ බුදුගෙයි වැඩ ඉන්නවා'' කියා කීවේය .

''හරි හීන් ආතේ, අපි යන්නම් '' කියා අපි බුදුගෙට ගියෙමු.

ඒ යන විට පොඩි හාමුදුරුවන් විසින් බුදුන් වැඳ සිටියේය. අපිද බුදුන් වැඳ පොඩි හාමුදුරුවන්ද වැන්දෙමු .

ඉන්පසු සියලු දෙනා බෝමලුවට ගොස් වාඩිගත්තෙමු .

පොඩි හාමුදුරුවෝ , මගේ පොඩිකාලේ ඉදන්ම හොඳ යාලුවෙක් . වයස අවුරුදු දහයේදි විතර , වගා කරපු වගාව විනාශ වුණ නිසා එතුමන්ගේ දෙමව්පියෝ වස බිලා පන නහගත්තා . පසුව ගමේ ලොකු හාමුදුරුවෝ, යටතේ පොඩි හාමුදුරුවෝ සසුන් ගත කරේ ගමේ හැමෝගේම ප්‍රධානත්වයෙන්.

'' සයුරලාට එන්නට කියලා මං උදේම, හීන් ආතා අතේ පණිවිඩයක් එව්වා එක ලැබෙන්න ඇති නේද ? '' පොඩි හාමුදුරුවෝ මගෙන් ඇසුවේය.

'' එහෙමයි හාමුදුරුවනේ, ඒකටයි අපි ආවේ '' මම පිළිතුරු දුන්නේමි.

'' සයුර දන්නවද අද ප්‍රතිඵල නිකුත් වෙනවයි කියලා'' පොඩිහාමුදුරුවෝ මගෙන් ඇසීය.

'' එහෙමයි හාමුදුරුවනේ '' මම පිළිතුරු දුන්නේමි.

'' එහෙමයි , එහෙමයි අපේ හාමුදුරුවනේ අදින් පස්සේ වසලා නං හමාරයි'' ජබ්බා එකවරම කිවේය.

'' ජනිත්, ඇයි බයවෙලා.. ප්‍රතිඵල එන්නේ තමන් උත්තර දුන් විදිහටයි. වගා කළ තරමට තමා අස්වැන්න නෙලන්න පුලුවන්වෙන්නේ ... නේද ජනිත්'' පොඩිහාමුදුවන් ජනිත්ට කීවේය .

''අන්න ඒකයි ''තරිඳු ජනිත්ගේ ඔලුවට ටෝක්කක් ඇන කිවේය.

''අනේ නිකන් පලයන් බං යන්න. උඹ එනවා මට කියන්න'' ජබ්බා තරියාට ඔලුවට ගසා කීවේය .

'' එහෙනම් , හාමුදුරුවනේ අපි ගිහින් එන්නම් '' කියා මම කියා පසුව පොඩි හාමුදුරුවන්ට වැද අපි පන්සලෙන් පිටත් වීමු. අපි එතනින් නික්මුනේ යාමට හරිහැටි තැනක් සිතා ගෙන නොවේ .

නමුත් මගදි ,

'' බං අද විතරයි මෙහෙම ඇවිදින්න වෙන්නේ... ඒ නිසා .. පැත්තට ගිහින් නාගෙන එමුද?'' යනුවෙන් ජබ්බා අපෙන් ඇසීය.

''හරි බං එළ... අන්න යමු'' චරියා ද ඊට එකග විය .

''සයුරයා මොකෝ කියන්නේ'' නෙවින්ද මගෙන් ඇසීය.

මම ද '' හා යමු'' කියා පිළිතුරු දුනි.

ඊන් පසුව අප සයදෙනාම ගග පැත්තට ගියෙමු. ගග අයිනේ උගුරුස්ස ,ඇඹුල්පේර, දං ආදි ගස් බොහෝමයකි . දනිදු දිවගොස් ඇඹුල්පේර ගසට නැග්ගේය . ජබ්බා උගුරුස්ස කඩා එකතු කරගැනිමට තම කමිසය ගැලවිවේය. මා ද දං කැඩිමට ගියෙමි . කඩා ගත් සියලු දේ රැගෙන පසුව අප ගග මැද ඇති පර්වතයට නැග එහි වාඩි විමු . එකිනෙකා කඩාගත් දේ අනෙකා අතර බෙදාගෙනීම අපේ පුරුද්ද වියග පලතුරු කෑමෙන් අනතුරුව අප කරන්නේ කලිසම් කමිස ගලවා පර්වතය උඩ තබා ගගට පැනීමයි .

ජබ්බා මහත නිසා ඔහු පර්වතයේ සිට පනින්නේ නැත . ඔහු පර්වතයෙන් බැස ගගට බසී .

'' වැඩක් කරමුද ?'' චරියා අපෙන් ඇසීය .

'' මොකක්ද '' මම ඇසිමි.

'' වැඩිම වෙලාවක් වතුර යට ඉන්න එකා බලමුද ?'' ඔහු යලිත් ඇසීය .

'' හා , මං ගණන් කරන්නං'' ජබ්බා පිළිතුරු දුන්නේය .

'' එහෙනම් හැමෝම නහය වහගනිල්ලා'' කියා නෙවියා කීවේය .

ජබ්බා ගණින්ට පටන් ගත්තේය. ''එකයි , දෙකයි , තුනයි '' තුනයි කියද්දී ම , අප සය දෙනාගෙන් පස් දෙනෙක්ම ගග තුළට ඔලුව ඔබා ගත්තේය . නමුත් ජබ්බා එසේ නොකර අප යලි මතුවන වේලාව බලා ඔලුව ඔබා ගත්තේය . එය දුටු අප ඔහුට එදින හොඳටම තඩි බෑවෝය .

හොරාවක් පමණ කාලයක් ගගෙහි ක්‍රීඩා කළ අපි යළිත් පර්වතයට ගියේ ඇඳුම් ඇඳගැනීමටයි .

නමුත් ඇඳුම් එහි නොවීය . අපට කරකියා ගැනීමට දෙයක් නොමැති විය .

'' අඩෝ කෝ ඇඳුම්...'' චරියා විමසිලිමත්ව ඇසීය .

'' ඇයි බං මෙතනනේ තිබ්බේ '' නෙවියා කීවේය.

අප සෑම තැනම ඇඳුම් සොයන්නට විය . එකවරම ,

'' ඕයි අර බලපන් අන්න ඇඳුම් ටික '' ජබ්බා අත දිගු කරමින් පෙන්විය.

'' අඩෝ අර වඳුරා '' තරියා ද උඩ බලාගෙන කීවේය.

ගං වෙරළේ වූ අඹ ගසක සිටි වඳුරෙක් අපේ ඇඳුම් ගෙනවිත් ගොසින්ය . ගං වෙරලට දිව ගිය අපි වඳුරාට ගල් ගසා එළවා දැමීය. අනතුරුව දනියා ගසට නැග ඇඳුම් ටික ගත්තේය .

'' මගේ කමිසේ කෝ '' චරියා ඇසීය. අපි ඇදුම් ඇඳගනිමින් සිටියෙමු . නමුත් චරිත්ගේ කමිසය එහි නොවීය .

'' අන්න අරූ අරන් යනවා .. '' ගස් අතරින් පැනපැන යන වදුරා පෙන්නමින් තරියා පැවසීය .

'' අයියෝ '' මං ඔලුවට අත ගසා ගත්තේය.

'' කමක් නෑ බං දැන් ගෙදර යමු '' නෙවින්ද කීවේ සිනාසෙමින්ය .

'' පිස්සුද බං , මෙහෙම පාරේ යන්න '' මගෙන් චරිත් ඇසුවේය.

'' හරි බං එහෙනං උඹ හිටපන් අපි යංනං '' ජබ්බා කිවේය .

'' උබට අද මං '' කියා ජබ්බාගේ බඩට චරිත් ගැසුවේය .

'' හරි එහෙනං තරියා උඹ ගිහින් උඹේ කමිසයක් ඉක්මනට අරන් වරෙන් '' මම තරිදුට කීවේ අප අන් කාගෙවත් නිවේස් වලට වඩා ඔහුගේ ගේය ළග හෙයිනි . වේලාව දහයයි තිහ පමණ විය.

තරිදු කමිසය රැගෙන එමින් සිටින බව දුටු මම ''අන්න ගෙනවා .'' කියා චරිත්ට පැවසීය .

'' ආ ගනින් '' කියා තරිදු චරිත්ට කමිසය විසි කළේය .

කමිසය ඇගලා ගත් චරිත් ''හරි යමු'' කියා කිවේය.

'' හරි දැන් කොහෙටද යන්නේ '' කියා ජනිත් ඇසුවේය.

'' තව ටිකකින් ප්‍රතිඵලත් ඒවි '' මම කීවේමි .

'' අපේ ගෙදර යන්න බෑ ''

'' අපේ ගෙදරත් බෑ ''

'' අපෙත් බෑ''

'' අපේ කොහොමත් බෑ''

'' බෑ '' යනුවෙන් ජනිත්ගෙන් ඇරඹ පස් දෙනාම එක පෙළට කියන්නට විය.

'' හා ,අපි කඩේට යමු'' නැවතත් ජබ්බා කීවෙය .

''ඔව් යමු'' සියල්ලෝම පිළිතුරු දුන්නෝය.

''හරි එහෙනං'' කියා මා ද ඊට එකඟ වුනෙමි .

කඩේ අසලට ගිය පසු ජබ්බා මේසයේ පුටුවක් ඇද වාඩිවී,

''ප්ලෙන් ටී හයයි '' යනුවෙන් අම්මාට ඇසෙන පරිදි කිවේය .

'' යකෝ මු , පැයකට ඉස්සෙල්ලා නේද කාලා ගියේ ?'' යනුවෙන් අම්මා ඇසීය .

'' අතීතයේ ජීවත් නොවන්න , වර්තමානයේ සිටින්න'' යනුවෙන් ජබ්බා නැවත කීය .

'' උඹ කියනකං හිටියේ '' අම්මා නැවත උත්තර දී ,

'' ඉතුරු වෙච්ච කොළකැද ටිකක් තියෙනවා බොනවා නං''යැයි කීවාය .

'' ඉතුරු වෙච්ච ඒවා කන්න අපි කපුටෝද අනෝමා අම්මේ '' යනුවෙන් ප්බ්බා කීවේය .

''උඹට මම'' කියමින් අම්මා පොල්කටු හැන්දද රැගෙන ප්බ්බා වෙත ආවාය .

ඉක්මනින් පුටුව අයින් කර නැගිට මේසය වටා දිව යන්නට විය .

'' නෑ..... ඒවා වුනත් කමක් නෑ අනෝමා අම්මේ බොමු '' ලෙස ඔහු යළිත් කිවේය.

අම්මා ''එහෙනං ඉන්න'' කියා යළිත් කුස්සියට ගියේය .

'' උඹලැ අම්මා ඕලිම්පික් ගියොත් රන් පදක්කම් ගහනවා ෂුවර් , දුවලා '' කියා පුටුව අදිමිනි ප්බ්බා කීවේය .

අම්මා විදුරුව හයකට කොළකැඳ දමා මේසයට ගෙනවිත් අපි හය දෙනාම හකුරු කා කොළකැඳ බීවෙමු .

'' මෙවර සාමාන්‍ය පෙළ ප්‍රතිඵල තව සුලු මොහොතකින් නිකුත් කරන බව අධ්‍යාපන ඇමති මිට සුලු මොහොතකට පෙර මාධ්‍යට ප්‍රකාශ කළා '' යනුවෙන් ගුවන් විදුලියෙන් හඬක් නික්මිණි . එවිට ජබ්බාගේ මුහුණ රතු පැහැති විය . චරියාද මාගේ මුහුණ දෙස බලන්නට විය . නෙවියාට හා තරියාට දහඩිය දමන්නට විය . දනියා දිග සුසුමක් හෙළීය .

නෙවියා තම ජංගම දුරකථනය මේසය උඩ තැබීය .

'' සියලු සාමාන්‍ය පෙළ ශිෂ්‍යන්ට දැං තම ප්‍රතිඵල අධ්‍යාපන අමාත්‍යංශ නිළ වෙබ් අඩවියෙන් දැං ලබා ගත හැක . '' යළිත් ගුවන් විදුලියෙන් හඬක් නික්මිණි .

'' හා එහෙනං කට්ටියම විභාග අංක ටික මෙකේ ලියනවලා '' මම අම්මාගේ කඩේ බිල් පොතෙන් කඩා ගත් කොළයක් හා පෑනක් මේසය මත තබමින් කීවේමි . මුලින්ම චරියාද , ජබ්බාද , තරියාද , තරියාද , නෙවියාද පසුව දනියාද එහි ඔවුන්ගේ විභාග අංක පිළිවෙලින් ලියා කොළය හා පෑන නැවත මේසය මත තැබීය .

'' දැං කාගෙද මුලින්ම බලන්නේ ? '' මම ඔවුන්ගෙන් ඇසුවෙමි.

'' ඔය ලියලා තීන පිළිවෙලට බලමු '' චරියා උත්තර දුන්නේය . මම මුලින්ම ඔහුගේ අංකය ඇතුලු කළෙමි .

'' A2 , B6 , C1 '' ලෙස ඔහුගේ අංකය ඉදිරියෙන් පෑන රැගෙන මම සටහන් කළෙමි .

'' අම්මෝ , පාස් ඇති යන්තං '' කියා ඔහු සුසුමක් හෙළීය .

ජබ්බා පුටුවෙන් නැගිට යාමට සූදානම් විය .

'' ඕයි උඹ කොහේද යන්නේ , දැං උඹේ එක බලන්නේ '' තරියා ජබ්බාට කීවේය .

'' උඹලා බලාපල්ලා මං පොඩි හදිස්සියකට ගිහින් එන්නං '' ඔහු පිළිතුරු දුන්නේය .

'' නෑ බලලම පලයං ල එතකොට තව හොදට යයි '' නෙවියා කියා අතිනි ඇද ජබ්බාව නැවත පුටුවෙන් වාඩි කළේය .

'' A1 , B2 ,C1 , S5 '' ලෙස ජබ්බාගේ අංකය ඉදිරියෙන් මම සටහන් කළෙමි .

'' A1 , B2 ,C1 , S5 '' ලෙස ජබ්බාගේ අංකය ඉදිරියෙන් මම සටහන් කළෙමි .

'' A තියෙන්නේ මොනාටද බං '' ජබ්බා මගෙන් ඇසීය .

'' ඉංග්‍රිසි වලට '' මම පිළිතුරු දුන්නේමි .

'' යකෝ ඒක '' තරියා ජබ්බාගේ පිටට ගසමින් කිවේය .

'' උබ මරු බං ඔන්න උඹේ හීනේ බේරිලා . '' දනියාද කිවේය .

'' අම්මෝ ඇති යන්තං '' ජබ්බා අත් දෙක වැඳ දෙවියන්ට ස්තුති කළේය .

'' A3 , B1 , C5 '' ලෙස නෙවියා ගේ අංකය ඉදිරියෙන් මම සටහන් තැබීමි .

'' A5 , B2 , C1 '' ලෙසින් දනියාගේද '' A2 , B5 , C2 '' තරියාගේ අංකය ඉදිරියෙන් මම සටහන් තැබීමි .

දැං ඉතිරිව ඇත්තේ මාගේ අංකයයි . පසෙක යහලුවන්ද ල අනෙක්පස අම්මාද බලාපොරොත්තු පිරුණු ඇස් වලින් මා දෙස බලා සිටින්නට විය . චරියා දුරකථනය මාගෙන් උදුරා ගෙන මාගේ අංකය ඇතුළත් කළේය .

'' A9 , දිස්ත්‍රික්ක ස්ථානය 01 , සමස්ථ ලංකා ස්ථානය 10 '' මෙසේ ඔහු මාගේ අංකය ඉදිරියෙන් සටහන් තැබීය .

මට ඇති වූයේ දරා ගත නොහැකි සතුටකි . එකවරව උඩ සිට කොළය මතට වැටී එය තෙත්වී ගියේය . අපි සියලු දෙනා එවිට උඩ බැලුවේ කඩේ වහලයෙන් වතුර වැටීමට හේතුවක් නැති නිසාය . ඒ වතුර බිඳුවක් නොවේ . අම්මාගේ ඇසෙන් වැටුණු කඳුලකි . සතුටු කඳුලකි ඇය මා සිප වැළඳගත්තේ සතුටු කඳුලු පිසදමමිනි. මගේ මිතුරන්ද තම පුටු වලින් නැගිට මා වැළඳගත්තෝය .

'' මං දැනගෙන හිටියා , මගේ පුතා මෙහෙම කරයි කියලා '' ඇය මගේ හිස අතගාමින් කීවාය .

ඒ වෙලේ මට දැනුනු සතුට වචන වලට හරවන්න නොහැකි තරමිය . මන්ද කියතොත් මගේ පියා අප හැර ගියේ මගේ අම්මට මගේ වගකිම සම්පූර්ණයෙන්ම ඉතුරු කරය . ඇය මා වෙනුවෙන් , මා මේ තත්ත්වයට ගෙන ඒම වෙනුවෙන් නොකළ දෙයක් නම් නැති තරමිය .

එසේ මා හැදූ ඇගේ එකම ඉල්ලීම , බලාපොරොත්තුව ආශාව වුයේ යම් දිනක මා උසස් තැනකට එනු දැකීමටය . එය මාගේ එකම සිහිනයද විය . අද මා එහි පළමු පඩිය නැග ඇතැයි මට හැගුණි .

මාගේ මිතුරන්ද නිවෙස් බලා යාමට සුදානම් වුයේය .

'' මචං දැං බය නැතුව ගෙදර යතහැකි '' ජබ්බා මට කිවේය .

'' ඔව් ඒ උඹ නිසා '' තරියා මගේ පිටට තට්ටු කරමින් කිවේය .

'' උඹ අපිටත් ගොඩ යන්න උදව් කළා , පිං මචං '' නෙවියා මට කිවේය .

'' හරි මචං අපි යාලුවෝ නේ... එහෙම තමා '' මම සිනා සෙමින් කීවේමි .

'' ඔව් බං ඒක ඇත්ත '' නෙවියා යළිත් කීවේය .

'' එහෙනං දැං කට්ටියම ගෙදර ගිහින් හවසට පන්සල් යමු නේද ? '' මම ඔවුන්ගෙන් ඇසිමි .

'' ඔව් අම්මලත් එක්කම යමු '' තරියා කීවේය .

ඔවුන් කඩයෙන් පිටතට ආවෝය .

'' අනෝමා අම්මා අපි යනවා, හවසට පන්සලේදී හමුවෙන බලාපොරොත්තුවෙන් අදට සමු ගන්නවා '' ජබ්බා සිනාසෙමින් කීවේය .

මගේ පිටුපස උන් අම්මා සිනාසෙමින් හිස වැනුවාය . පසුව ඈ කඩය තුළට ගියාය . මිතුරන් ඈතට යන තෙක්ම මම ඔවුන් දෙස බලා සිටියෙමි .

'' කොල්ලා ඉහළින්ම පාස් අක්කේ , දිස්ත්‍රික්කෙන් පළවෙනියා, ලංකාවෙන් දහවෙනියා '' අම්මා සෝමා නැන්දා හා කියවනු මට ඇසුනි . කඩේ යන එන සියලු දෙනා හා මේලෙසට අම්මා සතුට බෙදා ගත්තාය .

'' පුතේ දැං ගෙදර යමු '' කඩේ ලෑල්ල තබා එය වසන අතර අම්මා මට කීවාය .

'' හරි අම්මේ '' කියා මමද එළියට බැස්සේමි .

හතරවන පරිච්ඡේදය

මමද අම්මාද ගෙදර ගියෙමු . මම ගෙදර ගොස් ඇගපත සේදීමට ළිඳ බලා ගියෙමි . අම්මා සීයා හා මගේ ප්‍රතිඵල කියන්නට විය.

'' උඹේ පුතා රජෙක් වෙලයි නවතින්නේ දූවේ , මං උඹට කියලා තියෙනවනේ '' සීයා අම්මාට කිවේය .

'' තාත්තේ බාරේ ඔප්පු කරන්න අපි පන්සල් යන්න කියලා... තාත්තත් එනවද '' අම්මා සීයාගෙන් ඇසුවාය .

'' හරි මං එන්නං ... මං නැතුව කොහොමද ? '' කියා සීයා කීවේය .

වේලාව හය පමණ විය . අපි තිදෙනාම ගෙයින් එළියට බැස්සේ සුදු ඇඳුමින් සැරසීය . අම්මාගේ අතේ සුදු සහ කහ මල් වලින් පිරුණු මල් වට්ටි දෙකක්ද විය .

අපි පන්සලට පිටත් වුනෙමු . මගදි හමුවූ බොහෝ අය මාගේ ප්‍රතිඵලය විමසන්නට විය . ඒ සෑමට පිළිතුරු දුන්නේ මාගේ අම්මාය . එහි අයිතිය ඇයට නිසා මම නිහඬව සිටියෙමි . පන්සලට යන අතරමගදි ජබ්බා හා ඔහුගේ මව සෝමා නැන්දාද අප හා එක් විය . ගමන අතරතුර ,

'' නංගී උඹේ කොලුවා නිසා අපේ එකත් යන්තං ගොඩ '' සෝමා නැන්දා අම්මාට කීවාය .

'' අනේ එහෙම නෑ අක්කේ , ඒ අපේ ජනිත් පුතාගේ හැකියාව තමා '' අම්මා ඊට පිළිතුරු දුන්නාය .

කතාවෙන් කතාව අපි පන්සල ගේට්ටුව අසළටම ළගා වීමු . අද පන්සල ජනයාගෙන් පිරී ගොස්ය පන්සලේ පහන් වැටි සියල්ලම දැල්වී ගොස්ය . අපි බෝ මලුවට ළගා වීමු . අම්මා බෝධීන් වහන්සේ දෝවනය කරන්නට විය . පසුව අප තිදෙනාම බුදු මැදුරට ගියෙමු . එහි ගොස් මල් පුජා කළෙමු . එහිදි අපි පොඩි හාමුදුරුවන් හා ලොකු හාමුදුරුවන් මුණ ගැසුනෙමු . අප තිදෙනාම පොඩි හාමුදුරුවන්ට හා ලොකු හාමුදුවන්ට වැද ආශිර්වාද ගත්තෙමු .

'' සයුරලාගේ අම්මට ගොඩාක් සතුටුයි වගේ .'' ලොකු හාමුදුරුවෝ මවගෙන් විමසීය .

'' අනේ ඔව් ලොකු හාමුදුරුවනේ මෙයාව හදා ගන්න මං කොතරම් දුක් වින්දද'' අම්මා මගේ දෙස බලමින් කියන්නට විය .

''උපාසක අම්මා වාසනාවන්තයි , මේ වගේ දරුවෙක් ලබන්න'' ලොකුහාමුදුරුවන් කීවේය .

ඔවුන්ට ඔවුන්ගේ කතා බහකර ගැනීමට ඉඩ දී , මම බුදු මැදුරෙන් පිටතට ආවේමි . එහිදි තරියා මට මුණ ගැසුණි . ඔහු හා ජබ්බා ද , නෙවියාද , චරියාද විය . මම ඔවුන් ළගට ගියෙමි . දනියා කතෝලිකයෙකු බැවින් ඔහු පල්ලි ගොස් ඇත .

'' මචං උඹලා පහන් පත්තු කළාද ? '' නෙවියා අපෙන් ඇසීය .

'' නෑ බං , යන්ද .. ඒ පැත්තට '' චරියා කීවේය .

'' හා යමු '' මම පිළිතුරු දුන්නේම්

අපි පස්දෙනා එහි යන අතරතුර ජෙහාන් , උදාර හා රන්සර එහි විය .

'' බං උඹලා දැකලා තීනවද හිගන්නෙක්ට බත් එකක් ලැබුනම කොහොමද කියලා ? '' ජෙහාන් උදාරගෙන් ඇසීය .

'' නෑ බං'' උදාර පිළිතුරු දුන්නේය .

'' බලපන් මු දිහා , මුගේ මූන අද ඒ වගේ'' ජෙහාන් මගේ මුහුණ උදාරට හා රන්සරට පෙන්විය .

'' ජෙහාන් , මේ පන්සල හරි '' තරිදු ජෙහාන්ට කීවේය .

'' ඉතින් මොකද, ඕන තැනක තමන්ට අයිති මොන තැනද කියලා ඔය හිගන්නෝ දැන ගන්න ඕන '' ජෙහාන් පිළිතුරු දුන්නේය .

'' මනුස්සයෙක්ට ගරු කරන්න දැන ගන්න ඕනා . තැන මොකක් වුනත් '' මම ජෙහාන්ට පිළිතුරු දුන්නේම් .

'' මනුස්සයන්ට ගරු කරන්නත් දන්නවා , හිගන්නොන්ව එළවන්නත් දන්නවා'' ජෙහාන් යළිත් කීවේය .

'' අවජාතක හිගන්නා , අනේ මන්දා මු කාගෙද කියලා , මුගේ අම්මවත් දන්නවද දන්නේ නෑ ඒක'' උදාර සීනා සෙමින් කීවේය.

'' ඒයි කටපියන් හිටියා කියලා ඔලුවේ නගින්න එන්න එපා. උඹලට එදා බයත් නෑ, අද බයත් නෑ කට වහන් ඉන්නේ මගේ තත්ත්වේ තියාගන්න මිසක් උඹලට බයේ නෙමෙයි . මගේ අම්මට තව එක වචනයක් හරි කිව්වොත් මේ පන්සල කියලා බලන්නෑ , මං වගේ කටින් නැතුව වැඩ වලින් මාත් එක්ක හැප්පියන් '' ආවේගයෙන් මම උදාරට පිළිතුරු දුන්නේ අම්මා ගැන අනවශ්‍ය ලෙස කතා කිරීම නිසාය .

'' යමන් බං අපි යන්න ,'' තරිදුට මම කිවේමි .

අනතුරුව අපි පිටත්වීමට සුදානම් වුවත් යලිත් ෂෙහාන් , අසල නැවතුණු මා

''හොදක් , හොදක් විදිහට දකින්නත් . නරකක් , නරකක් විදිහට දකින්නත් හොඳ කොන්දක් තියෙන්න ඕනා බං '' කියා කීවේමි .

පසුව අපි පහන් දැල්වීමට ගියෙමු .

පහන් දල්වන අතර ''යකෝ ඉදලා ,ඉදලා මුත් දෙන්නේ මාර ටොක් නේ බං ... '' චරියා මා දෙස බලා කිවේය .

'' ඒක තමා මාත් බැලුවේ බං'' ජබ්බා ද කීවේය.

'' හැමදාම අහන් ඉන්න බැහැනේ බං... ඒකයි , ඒත් එහෙම කියලා අපි උන්ගේ තත්වෙට වැටෙන්න හොඳ නෑ බං.. මම පිළිතුරු දුන්නෙම් .

අපි පහන් පත්තු කරන අතර තුර අපට පිටුපස පහන් වැටද නංගිලා ටිකක් විසින් පහන් පත්තු කරන්නට විය . එහි ෂෙහාන්ගේ නංගී ද විය . නම්න් ඇය සරිතාය . දිගු වරලසකට හිමිකම් කී ඇය රූමත්ය . ඇය මේ වසරේ සාපෙල ලිවීමට සුදානම් වන අයෙකි .

පහන් දල්වමින් සිටි මාගේ නෙත ගැටුනේ ඈ වෙතය . මා ඈ දෙස බලා සිටින අතර ඇයද මා දෙස බලන්නට වුයේ එක පාරටමය . මගේ අතෙහි වූ පහන එකවරම බිම වැටිණි . ඇය මා දෙසට පිය නගන්නට විය .

ජබ්බා , තරියා , නෙවියා හා චරියා එකවරම ,

'' මොකො බං පහන කැඩුවේ ? '' කියා ඇසීය . නමුත් මම ඊට පිළිතුරු නොදුන්නෙම් .

'' සුභ පැතුම් සයුර අයියේ , ලංකාවෙන් දහවෙනියලු නේද ? '' අසා ඇය මට සුභ පැතීය .

'' ස්තූතියි නංගී '' කියා මම ඇයට පිළිතුරු දුන්නෙමි .

ඇය යළිත් හැරී යන්නට විය . ඒවෙලේ ඇය ගැන හැඟීමක් මට ඇති විය .

'' මොකක්ද බං ඒ වුනේ, කවිද බං ඒ ? '' ජබ්බා අසන්නට විය .

'' ඒක තමා මටත් හිතාගන්න බැරි '' අතෙහි තිබූ පහන වැටෙහි තබමින් කිවේය .

'' මේකයි වුනේ , අර කෙල්ල ආවා මූට සුභ පැතුවා ... මූ ස්තූතියි කිව්වා... කෙල්ල ගියා . '' චරියා කීවේය .

'' වුනේ නං ඕක තමා , ඒක නං අපිත් දැක්කනේ , අපි ඇහුවේ සයුරයට මොකද වුනේ කියලා '' නෙව්යා කිවේය .

'' ඒක උගෙන්ම අහමු නේ , '' චරියා යළිත් කිවේය .

'' මගෙන් අහන්නේ මොනාද බං ? ඔය දැක්කේ ... ඒ ළමයා ආවා මට සුභ පතලා ගියා එච්චරයි '' මම පිළිතුරු දුන්නෙමි .

'' හා මචං උඹ කියනවා නං එච්චරයි '' ජබ්බා කිවේය .

'' හැබැයි බං මං උඹට එකක් කියන්නං , ඒ ෂෙහාන්ගේ නංගී '' තරියා කිවේය .

'' හ්ම්ම් , මං ඒක දන්නවා '' මම පිළිතුරු දුනි .

අනතුරුව අප සියලු දෙනාම නිවෙස් බලා පිටත් වන්නට විය . මා ද තරිදු ද ඉදිරියෙන් ගමන් කළෙමු .

'' බං උඹ වැරදියට හිතන්නේ නැත්තං මං උඹට දෙයක් කියන්නද ? '' තරියා මගෙන් ඇසීය .

'' හා බං කියපන් , '' මම පිළිතුරු දුන්නෙමි .

'' අද පහන් වැට ළග වුන දේ පහන් වැට ළගම තියලා වරෙන්, මොකද උඹට ලොකු ගමනක් තියෙනවා . නිකන් අහක යන ලෙඩ දාගන්න ඕනේ නෑ නේද ? '' තරිදු මට කිවේය .

'' මං ඒක දන්නවා බං '' මම පිළිතුරු දුන්නෙමි .

'' එහෙනං හොදයි . '' තරියා යළිත් පිළිතුරු දුන්නේය .

'' හා , හා මූන් දෙන්නා මොනාද මේ ගෑනු ළමයයි පිරිමි ළමයයි වගේ කුටු , කුටු ගාන්නේ ? '' ජබ්බා එකවරම ඇසීය .

'' නෑ බං මේ බඩ තඩියෙක් හිටියා අපි එක්ක , ඌ කොහෙද කියලා බැලුවා ... '' තරියා සිනාසෙමින් කීය .

'' හාකෝ මල්ලි , මං බඩ තඩියා . හා '' ජබ්බා පිළිතුරු දුන්නේය .

'' තොප්පිය හරි නං දා ගනින් . '' තරියා නැවතත් කිවේය .

'' කොහොමත් අපි අහක යන තොප්පිත් දාගන්නවනේ'' ප්බ්බා කීවේය .

'' කතාවෙන් කතාව ගේ ළගටම ඇවිත් '' අම්මා සෝමා නැන්දාට කීවාය .

'' ඔව් නංගීයේ , එහෙනං අපි යනවා '' සෝමා නැන්දා කීවාය .

'' එහෙනම් දුවේ , බුදු සරණයි '' සීයා කිවේය .

'' බුදු සරණයි මාමේ '' තරිදුගේ මව කමලා නැන්දා පිළිතුරු දුන්නාය .

'' මචං අපි යනවා , පරිස්සමින් පලයන් ඔය ටික '' මම තරියාට කීවේමි .

''හරි මචං එහෙනං හෙට උදේට ලෑස්තිවෙලා ඉදපන් ඉස්කොලේ යන්න '' තරියා මට කීවේය .

'' අපි හයහාමාරට විතර එනවා '' නෙවියා කිවේය .

'' ආ හරි මචං '' මම පිළිතුරු දුන්නේමි .

අම්මා ගෙදර දොර ඇරියාය .

''පුතේ මුණ කට සෝදන් එන්න කෑම කන්න '' අම්මා මට කීවාය .

'' හා අම්මේ'' මම උත්තර දුන්නේමි .

ඇගපත සෝදා ගෙන කෑම කා නින්දට වැටුනේ හෙට පාසල් යාමට ඇති බව සිහිතබා ගෙනය . නිදා ගැනීමට සිතක් නැත.

'' අද පහන් වැට ළග වුන දේ '' මම එය මතකයෙන් ඉවත් කිරීමට සැදුවත් එසේ කළ නොහැකි තරමිය .

'' නෑ තරියා කියපු දේ හරි , මට කරන්න තව ගොඩක් දෙවල් තියෙනවා'' මම මටම කියා ගෙන නින්දට වැටුණි .

'' කුක්කු , කුක් කුක් '' එහා ගෙදර සුමනපාල මාමගේ කුකුළා හරියටම පාන්දරම පහට හඬලයි . ඒ හඬට සැමදාම අම්මා ඇහැරේ . පසුව ඈ තම කඩයට ගෙන යාමට කෑම සැදීමට කුස්සියට යයි . ගතවු මාස තුන තුළම සිදුවුයේ මෙයයි . නමුත් අද ඈ මගේ කාමරයට ආවාය .

''පුතේ , නැගිටින්න... පරක්කු වෙයි ඉස්කොලේ යන්න '' ඈ මට කීවාය .

''හරි අම්මේ පරක්කු නෑ '' මම කොට්ටය බදාගනිමින් කිවේමි .

'' තව ටිකකින් අර කොල්ලෝ ටිකත් එවි '' ඈ යලිත් මට කීවාය.

මම ඇඳෙන් බැස්සෙමි . එවිට ඈ මට තුවාය දික්කරාය . මම එයද රැගෙන ළිදට ගියෙමි . එවිට අම්මාද ළිදට පැමිණ , මුහුණ කට සෝදාගත්තාය .

'' අද කඩේ යනවද ? '' මම ඇයගෙන් ඇසුවෙමි .

'' නෑ අද යන්නේ නෑ '' මව පිළිතුරු දුන්නාය .

''එහෙනං උදේම ලෑස්තිවෙන්නේ කොහේ යන්නද ? '' මම යළිත් ඇසුවෙමි .

'' ලොකු හාමුදුරුවෝ ඊයේ කඩේට ඇවිත් මට ආරාධනා කළා . මගේ කොලුවා සම්මාන ගන්න විදිය බලන්න එන්න කියලා . '' ඇය පිළිතුරු දුන්නාය .

'' ආ එතකොට අම්මත් අද මාත් එක්ක ස්කෝලේ යනවද ? '' මම යළිත් ඇසුවෙමි .

'' ඔව් , '' කියමින් ඈ ගෙට ගියාය .

මඳ වේලාවකට පසු මමද ඇගපත සෝදා ගෙට ගියෙමි . වේලාව කෙමෙන් ගෙවී යන්නට විය .

'' අඩෝ සයුරයා , '' යනුවෙන් එළියෙන් හඬක් නික්මිණි .

'' මේ එනවා බං , '' කොණ්ඩය පිරමින් සිටි මම කිවේමි .

මම පොත් බෑගයද රැගෙන ගෙයින් එළියට බැස්සෙමි . එවිට මවද , සාරියකින් සැරසි මිදුලට බැස්සාය .

'' ආ අනෝමා අම්මා , කොයි යන්නේ ? '' ජබ්බා ඇසුවේය .

'' අම්මට අද ලොකු හාමුදුරුවෝ ස්කෝලේට එන්න කියලා '' මම පිළිතුරු දුන්නෙමි .

පාවහන් පැළඳ සාරිය සකසමින් ,

'' යමු නේද පුතාලා '' යනුවෙන් මව කියමින් පාරට බැස්සාය .

ඇය ඉදිරියෙන් යන්නට විය . අපි පස්දෙනා පිටුපසින් යන්නට වුවේමු . අතරමගදි දනියාද අප හා එක් විය .

කෙමෙන් අප සියලු දෙනා පාසල වෙත පිය නැංගෙමු .

පස්වන පරිච්ඡේදය

'' ආ , සයුරලගේ අම්මේ '' පොඩි හාමුදුරුවෝ එසේ කිවේ පාසල් ප්‍රධාන ගෙට්ටුව අසල සිටය .

අපි සියල්ලෝම පොඩි හාමුදුරුවන්ට වැඳ ආශීර්වාද ගත්තෙමු .

'' සයුරලා යන්න පන්ති වලට '' තියා හාමුදුරුවන් අපට කීවෝය . එවිට මම අම්මාගේ මුහුණ දෙස බැලුවෙමි .

'' අම්මා යමු කාර්යාලයට , අම්මා අද අපේ අරාධිත අමුත්තනේ '' කියා පොඩි හාමුදුරුවන් කියන්නට විය .

අම්මා හා පොඩි හාමුදුරුවන් කාර්යාලය දෙසට පිටත් වන්නට විය . අපි පන්තියට ගියෙමු . එවිට ෂෙහාන් ලාද පන්තියේ විය .

අපි ඔවුන්ව ගණන් නොගෙන පන්තියට ඇතුලු වුනෙමු .

'' කොග්ගලයේ මාහා පණ්ඩිතයා රාජ සභාවට පැමිණෙන්නේ ඔහුගේ ගෝල බාලයන් සමගය '' යනුවෙන් උදාර කියන්නට විය .

'' පැමිණොන්න උතුමාණෙනි , පැමිණොන්න '' යනුවෙන් දසුන් කියවන්නට විය .

ජෙහාන් ඉදිරියට පැමිණ '' කොන් ගැටුලේජන් '' කියා අත දික් කළේය . ජෙහාන් වෙනස් වි ඇත . මා හා මිත්‍ර වි ඇත . යනුවෙන් සිතා මමද ඔහුට අත දුන්නෙමි .

'' හිතන්න එපා උඹ මහා ලොකු දෙයක් කළා කියලා . හිගන්නා '' කියමින් ඔහු මගේ අත ඇඹරුවේය . දරාගත නොහැකි වේදනාවට මම කෑ ගැසීමි .

'' අත ඇරපන් යකෝ , '' කියමින් තරිදු ජෙහාන්ගේ අතේ නහරයක් තදින් ඇල්ලුවේය . එකවරම ඔහු කෑ ගසමින් බිම ඇද වැටුනේ අත පණ නැති වීම නිසාය . .

'' උඹට ලැජ්ජ නැද්ද බං , කරන කිසි දෙයක් ගණන් නොගෙන පාඩුවේ ඉන්න එකෙක්ට තව තවත් කරදර කරන්න . අනික ඌ ලංකාවෙන් ම දහවෙනියා ... කරලා තියෙන්නේ ලොකු දෙයක් නෙමෙයි අමාරු දෙයක් '' තරියා බිම වැටුණු ජෙහාන්ට ඇගිල්ල දිගු කරමින් කීවේය .

පසුව අපි එක ළග වීහිටි පුටු හා ඩේස් හයක් සෙවිමු . නමුත් සම්බ වුයේ පහක් පමණි . ප්බ්බාට ඩේස් එකක් හා පුටුවක් නොමැති විය .

ඔහු '' නංගීයා, ඔය පුටුවයි ඩෙස් එකයි මට දීලා අනිත් එකට යන්න මොකද මේ අයියලට මං නැතුව බෑ '' යනුවෙන් අසල වාඩිවි සිටි සංසලා නැමති සිසුවියව නැගිටුවා වෙන තැනකට යැවීය .

'' කරුණාවෙන් සවන් දෙන්න , පාසලේ සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් පාසල් පිටිටනියට රැස් වන්න ... ස්තුතියි '' යනුවෙන් ශබ්ද විකාශනයෙන් හඩක් නික්මිණි . ඒ පොඩි හාමුදුරුන්ගේ හඩය .

ඒ නිවේදනයට අනුව සියලු දෙනා පිටියට රැස් විය . අපිද එහි ගොස් තබා ඇති පුටු වල අසුන් ගත්තෙමු . ලොකු හාමුදුරුවන්, පොඩි හාමුදුරුවන් ඇතුලු ගුරුවරුන් හා අම්මාද ඉදිරි පෙළ ආසන වල සිටිනු දුටු මට ඇති වුයේ ඉමහත් සතුටකි . ඇගේ මුහුණද ආඩම්බරයෙන් පිරි ගොස්ය .

'' අවසරයි ඔබ සැමගෙන් අද අපි මෙලෙස එක් රැස් වි සිටින්නේ මෙවර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉහළ ප්‍රයක් ලබා ගෙන අප පාසලට කීර්තියක් අත් කර දුන් ශිෂ්‍යකු ඇගයීමටය . ඒ සඳහා ඔබ සැම සාදරෙන් පිළිගන්නවා ''

යනුවෙන් හඬක් නික්මිණි ඒ උත්සව වේදිකාවේ සිටය . කාගේ කටහඬ දැයි පැහැදිලි නැත .

'' මා මේ අවස්ථාවේ ආරාධනා කර සිටින්නේ අප ගෞරවණීය විදුහල්පති පුජ්‍ය නාකන්දේ රාහුල හිමියන්ටය . '' එවිට ලොකු හාමුදුරුවන් තම අසුනෙන් නැගිට වේදිකාවට නැග්ගේය . පසුව,

'' මුලින්ම අපි පන්සිල් සමාදන් වෙමු . '' යනුවෙන් පවසා පන්සිල් සාමාදං වීමට විධාන ලබා දුන්නේය . අනතුරුව එය අහවර විය . පසුව එතුමා ,

'' ඔබ සැම දන්නවා බොහෝ අවස්ථා වල මේ අපේ පුංචි පාසල ඉහළ ජයග්‍රහණ වලට හිමිකම් කියනවා . ක්‍රීඩා අතින් , ඉගෙනීම අතින් අපේ පාසලට පූලුවන් වෙලා තියෙනවා , මේ පුංචි පාසලේ නම ඉහළට ගෙනියන්න . ඉතින් මීට පෙර පාසලේ නමට කීර්තියක් වුනු දරුවන් අතර ඉහළින්ම නම තියා ගෙන සිටින දරුවෙක්ට නැවත හැකි වෙලා තියෙනව , මේ අපේ පාසලේ නම ඉහළට ගෙනි යන්න . ඉතින් ඒ දරුවට වේදිකාවට අරාධනා කරන්න කියලා නිවේදක දැරියට මම වේදිකාව බාර කරනවා '' යනුවෙන් පවසා වේදිකාවේ මදක් පසෙකට විය .

'' එහෙමයි ලොකු හාමුදුරුවනේ , පාසලේ නමට මහත් කීර්තියක් ගෙන ඒමට අද ඔහුට හැකි වෙලා . නමින් ඔහු සයුර , සයුර කාවින්ද අධිකාරී... ඉතින් මම අපේ සයුර අයියට වේදිකාවට ආරාධනා කරනවා . '' නිවේදිකාව එසේ කියා අවසාන වෙද්දීම අත්පොළසන් නාදයෙන් වේදිකාව පාසල් පිටිය සිසාරා ගියේය .

ඒ අත්පොළසන් මැද මම වේදිකාවට නැග්ගෙමි . එහිදි ඉදිරි අසුනේ සිටි මව දෑසින් ගලා ආ සතුටු කඳුලු සාරි පොටින් පිසදමනු දුටුවෙමි .

'' ඉතින් සයුර අයියේ , බොහෝ අවස්ථා වල වගේ අදත් ඔබට පුලුවන් වෙලා අපේ පුංචි පාසලට කිර්තියක් එක් කරන්න . ඉතින් ඔබේ අදහස දැනගන්න අපි කැමතියි . '' යනුවෙන් නිවේදිකාව නැවත නිවේදනය කරාය . ඒ සාරිතා ය . ඈතදී මට නොපෙණුන , මාගේ නම නිවේදනය කර ඇත්තේ පෙරදින මා පහන් වැට ළග දුටු ඇයයි . කෙසේ වෙතත් දැං මා ඇය දෙස බලාගෙන සිටිමට කාලයක් නොවේ . මම වේදිකාවේ මයික් බොනුව ඇති තැනට නැග්ගෙමි .

'' මම සයුර අධිකාරි . ගොඩක් ගමේ අය මා දන්නේ , ජේලේ කියලා . අද මට පුලුවන් වුණා අපේ පාසලට කීර්තියක් වෙන්න . මේක මම තනියම ආපු ගමනක් නම් නෙමෙයි . මගේ මේ පාසලේ ගුරුවරු තමයි මේ මගේ ගමනට පාලම දැම්මේ , මම කළේ ඒ පාලම හරහා ගමන් කරපු එක විතරයි . විශේෂයෙන් මගේ ගමනට ප්‍රධානම දිරිය වුනේ මගේ අම්මා , උදේ හවා ඈ මා වෙනුවෙන් බොහෝ දුක් විඳිනවා . ඒ නිසා විශේෂයෙන් මගේ අම්මටයි , මට වචනෙකින් පවා සහයෝගය දුන්නු ඒ සියලු දෙනාට ස්තූති කරනවා . මගේ කෘතඥතාව පළකරන්න මෙය අවස්ථාවක් කරගන්නවා . ඒ වගේම කියන්න කැමති කොච්චර බාධක ආවත්, ඒ හැම එකකින්ම මාව ආරක්ෂා කරපු මගේම සොහොයුරන් පස් දෙනෙක් ඉන්නවා . ඒ අයට ස්තූති කරන විදිහ මට තේරෙන්නේ නෑ .

ජනිත් , චරිත් , නෙවින්ද , තරිඳු , දුනිඳු මේ පස්දෙනා තමයි මට හයියක් වුනේ . ඒ අයට මේ වේදිකාව උඩ ඉඳන් හදවතින්ම අත්පොළ සන්නාදයක් දෙන්න, මා හා එකතු වෙන්න කියලා මං ඉල්ලනවා . '' යනුවෙන් පවසා මං අත්පොලසන් දීමට පටන් ගත්තෙමි .

සැවොම අත්පුඩි ගසන අතර ,

'' අරූ ගේ කියව්ල්ල අහන් ඉන්න බෑ බං '' යනුවෙන් ෂෙහාන් අසළ සිටි උදාර කිවේය .

'' දැං අපිට නැගිටලා යන්නත් බෑනේ බං මෙච්චර සෙනගක් අස්සේ , '' ෂෙහාන් ඔහුට කීවේය .

'' ඒ මදිවට උඹලෑ නංගිත් කියවන්නේ සයුරයා නංගීගේ කවුරු හරි වගේනේ '' උදාර කිවේය .

'' හරි බං , ඒ එයාගේ වැඩෙනේ '' යනුවෙන් ෂෙහාන් කිවේය .

'' ඉතින් අයියේ අවසාන වශයෙන් අපිට පොඩි උපදෙසක් අයියට දෙන්න පුලුවන්ද ? '' සාරිතා යළිත් මා දෙස බලා නිවේදනය කළේ මා හා මඳ සිනහවක් පාමිනි .

'' උපදෙස් දෙන්න තරම් මම සුදුස්සෙක් නෙමෙයි . මොකද මම මෙතන ඉන්නේ මගේ ගුරුවරුන්ගේ උපදෙස් නිසයි . ඒත් එක දෙයක් කියන්න කැමති සාර්ථකත්වය කියන්නේ අපි හොයාගෙන යන්න ඕනා දෙයක්... නැතුව අපිව හොයාගෙන එන දෙයක් නෙමෙයි . '' මම කිවේමි .

'' අනිවාරෙන්ම , එසේනම් දැං අවස්ථාව එලඹ ඇත්තේ අපේ මේ කීර්තිධර ශිෂ්‍යාට හිමි සම්මාන ලබා දිමටයි . මම ඒ සඳහා ආරාධනා කරන්නේ අපේ ගරු විදුහල්පතිතුමාටයි '' ඇය යළිත් කීවාය .

ලොකු හාමුදුරුවන් නැවත වේදිකාව ඉදිරියට ආවේය .

'' ඔව් , මං කැමති වේදිකාවට ආරාධනා කරන්න අපේ මේ පුතාගේ ප්‍රයත්නයට දිරිය වුනු ප්‍රධාන කාන්තාවට , සයුරගේ අම්මේ එන්න වේදිකාවට '' ලොකු හාමුදුරුවන් කිවේය .

එවිට අම්මා වේදිකාවට නැගීමට ආවාය . සාරිය නිසා ඇයට පඩි නැගීමට අපහසු බවක් මට හැඟුනි . මම ගොස් ඇයට වේදිකාවට නැගීමට උදව් කළෙමි . පසුව අපි වේදිකාවේ මැදට ගියෙමු . අනතුරුව පාසලේ උප විදුහල්පති , පොඩි හාමුදුරුවන්ට ශිෂ්‍ය නායිකාවක් විසින් සම්මානයක් හා ලියුම් කවරයක් බහාලූ තැටියක් ගෙනවිත් දුන්නාය .

'' මේ අද දවසේ වැදගත්ම අවස්ථාව , දැං අපේ විදුහල්පතිතුමා විසින් අපේ අයියට සම්මාන ප්‍රධානය කරන්නටයි සූදානම් වෙන්නේ , ඉතින් අපි හැමෝම ලස්සන අත්පොළසන් නාදයක් දෙමු . '' නැවත සාරිතා නිවේදනය කළාය .

පොඩි හාමුදුරුවන්, ලොකු හාමුදුරුවන් හට සම්මානය දුන්නේය . ඔහු එය මට පිරිනැමීමට සැරසුනි .

'' හාමුදුරුවනේ සම්මානය හිමි වෙන්න ඕනා මට නෙමෙයි , මගේ අම්මට ... ඒනිසා මං කැමති මගේ අම්මට සම්මානය දෙනවනං , '' මම හාමුදුරුවන්ට කීවේමි .

ලොකු හාමුදුරුවන් සිනාසී එය මවට දුන්නේය . එදින මා හට දැනුනේ කියා ගත නොහැකි සතුටකි . මන්ද මුලු ගමේම අත්පොළසන් නාදය මත මව අද සම්මානයට පාත්‍ර කිරීමට මට අද හැකි විය .

ලොකු හාමුදුරුවන් , '' මේ අධ්‍යාපන ආමාත්‍යශයෙන් අපේ සයුර වෙනුවෙන් බැංකු පොතක් විවෘත කරලා . එයාගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් '' යනුවෙන් පවසමින් ලියුම් කවරයක් ද මවට දුන්නේය .

'' එසේනම් අද අපි මේ උත්සවයේ අවසානයට පැමිණුනා . තවත් ඉදිරි ප්‍රයත්නයන්ට සුභ පතමින් අපි මෙතනින් නවතිමු . '' සාරිතා නැවත නිවේදනය කළාය . මඳ වේලාවකට පසුව සියලු දෙනා විසිරි ගියෝය .

'' පුතා මාත් යන්නම් එහෙනං . ඔයාට දවල්ට කන්න හදන්නත් එපැයි '' අම්මා මට කීවාය .

'' හා අම්මේ '' මම පිළිතුරු දුන්නේමි .

'' හා , අපිටත් එක්ක හදන්න ඇ, අපි පස්දෙනත් එනවා අද දවල්ට '' ප්‍රබ්බා අම්මාට කිවේය .

'' ඒ මොකටද ඒ '' මම ප්‍රබ්බාගෙන් ඇසුවේමි .

'' සතුට සමරන්න තමා ඉතින් '' ප්‍රබ්බා නැවත කීවේය .

'' හා , හරි උඹලා වෙනදටත් මට කියලද ඇයි එන්නේ . '' අම්මා සිනා සෙමින් කිවාය . එවිට සියල්ලෝම සිනාසීය .

'' හරි අද කිව්වනේ ... '' තරියාද ජබ්බාට හවුල් විය .

'' හා , එන්න .. එහෙනං මං යනවා '' කියා අම්මා පිටත් වීමට සූදානම් විය .

'' ආ මේකත් අරන් යන්න , '' මම අම්මාට සම්මානය දෙමින් කිවේමි .

'' හා , දෙන්න '' මඳ සිනාහවක් පෑ , ඇය එය තුරුලු කර ගත්තාය . පසුව ඇ යන්නට පිටත් විය . ඇය ගේට්ටුවෙන් පිටවන තුරු අපි බලා සිටියෙමු .

අනතුරුව අපි පන්ති කාමරයට පිටත් වුනෙමු . උඩු මහළට නැගීමට අපි හය දෙනාම එක පෝළිමට සිට ගත්තෙමු . මුලු පඩි පෙළම අපි අරක් ගෙනය . අපි පඩි පෙළ නැග පන්ති කාමරයට ඇවිද ගියෙමු . එකවරම අප ඉදිරියට නංගිලා සිව් දෙනෙක් දිව ආහ . ඉන් එක් අයෙක් වේගයෙන් දිව විත් මගේ ඇගේ හැපිණි . ඇගේ අතේ තිබු පොත් ටිකද බිම වැටුණි .

ඒ සාරිතාය . අප දෙදෙනා ට දෙදෙනා අපගේ මූහුණ බලා සිටින්නට විය . විනාඩි කිහිපයක් ගත විය . එකවරම සාරිතා ගෙ ඊටුපස සිටි අකිලා , කහින්නට විය . තරිඳු ද මගේ පිට කෙනිත්තුවේය . පියවි සිහියට දෙදෙනාම පැමිනියේ එවිටය . සාරිතා තම පොත් ඇහිදිමට බිමට පාත්විය . මමද පාත් වි ඇයට උපකාර කළෙමි .

'' යන්නම් අයියේ '' කියා ඈ නැගිට්ටාය .

'' අයියේ දැං යමුද ? '' ජබ්බා සිනාසෙමින් මගෙන් ඇසීය .

පසුව අපි පන්තියට ගියෙමු .

එවිට ලොතු හාමුදුරුවන්ද එහි සැපත් විය . එවිට අපි නැගිට්ටෙමු .

'' හොදයි දරුවනේ දැං අපි මේ ඇවිත් ඉන්නේ එක ඉමක් පසු කරලා තවත් ඉමකට ...

පිවිතේ බොහෝ දෙවල් මේ ඉනිමේදි තමා තීරණය වෙන්නේ . මං දන්නවා මේ කාලේදී හිතට යම් දේවල් ඇතුලු වෙනවා .

ඒත් හිතලා බලන්න දකුණු අතින් වෙන අකුරක් ලියන ගමන් වම් අතින් තව අකුරක් ලියන්න බෑ නේද ? ඒ නිසා ඉගෙනීමට මුල් තැන දෙන්න . '' කියා එතුමා පන්තියෙන් පිටත් විය .

අලුත් පන්තියේ ගුරුවරුන් පැමිණ අපට ඔවුන්ව හඳුන්වා දුන්නේය . වේලාව ගත විය . පාසලේ අවසාන සීනුව නාද විය .

පාසලෙන් පිටත් වූ අපි කෙළින්ම ගියේ අපේ ගෙදරටය . හය දෙනාම සුදු ඇඳුම් පිටින්ම එහි ගියෙමු .

'' අනෝමා අම්මා , අපි ආවා... '' කියමින් ජබ්බා සපත්තු මේස් ගළවා ගෙට ඇතුලු වුයේය .

අපිද සපත්තු මේස් ගලවා ගෙට ඇතුලු වුනෙමු . පසුව පාසල් කමිස ගලවා පුටු වල වාඩි වුනෙමු .

මම එවිට රූපවාහිනිය දමා විවධ නාළිකා මාරු කළෙමි .

'' ආ , ආ ... අරක තියපන් '' ජබ්බා එකවරම කිවේය .

ඒ ක්‍රිකට් තරගයක් විකාශය වන නාළිකාවකි . අපි හය දෙනාම එයට යොමු වුනෙමු .

ඒ අතරතුර අම්මා කෑම මේසයට කෑම තබන්නට විය .

'' ආ .. ළමයි කාලා ඉන්න ... '' ඒ අතරතුර ඇය අපට කිවාය .

'' ආ , ඉන්න අපි එන්නං මේ ලාස්ට් ඕවර් එක '' තරිඳු කිවේය .

'' ආ , එහෙනං මං කෑම ටික කූඩෙන් වහනවා '' මව එවිට කිවාය .

'' ආ , හරි අනේ '' ජබ්බා පිළිතුරු දුන්නේය .

'' ලාස්ට් ඕවර් එකට ලතුණු තුනයි බං ගහන්න තියෙන්නේ .. මුං දිනනවා '' තරිඳු කිවේය .

එවිට '' කියන්න බෑ '' නෙවියා කීවේය .

'' හ්ම් '' මමද හිස වැනුවෙමි .

'' මේ නිවේදකයා මාරම විදියට නිවේදනය කරනවා බං '' ජබ්බා ද කිවේය .

අපි පස් දෙනා බලා සිටින්නේ තරගය කවුරු දිනයිද කියාය , නමුත් ඔහු නිවේදකයාව අධ්‍යනය කරන්නට විය .

'' ඕ ෂිට් අවුටිනේ '' තරිඳු එකවරම කිවේය .

'' මං කිව්වනේ '' එවිට නෙවියා කිවේය .

'' හා , හා දැං යමු කන්න '' මම ඔවුන්ට කිවේමි .

'' ඔව් දැං මගේ බඩේ පණුවෝ මැව් එකක් ගහයි වගේ'' ප්බ්බා සිනාසෙමින් කියන්නට විය . අපි හය දෙනාම කෑම මේසයට වාඩි වුනෙමු .

කෑම බෙදා ගැනීමට මුල් වුයේ ප්බ්බාය .

මඳ වේලාවකට පසු '' පුතාලා ඉන්න මං ඉක්මනට සෝමේ මාමලැ කඩේට ගිහින් එන්නං '' කියා අම්මා එළියට ගියාය .

අපි කෑම කා අත් සෝදා නැවත රූපවාහිනිය අසළට ගියෙමු . එවිට අම්මා අයිස්ක්‍රීම් එකක්ද රැගෙන ගෙට ඇතුලු විය .

'' අතුරු පසත් ගෙනල්ලා , '' ප්බ්බා සිනා සෙමින් කියන්නට විය .

''හා එන්න දාගෙන කන්න'' ඇය කැබිනට්ටුවෙන් ගෙන සෝදා ගත් අයිස් ක්‍රීම් කොප්ප හා හැඳි මේසයට තබමින් කිවාය . නමුත් මෙවර නම් මුලින්ම දිවගියේ ප්බ්බා නොව දනියා ය . දනියා අයිස්ක්‍රීම් කෑමට ඉතා ප්‍රිය ක්‍රියා

'' එහෙනං අනෝමා අම්මා , අපි ගගට ගිහින් නාලා එන්නම් '' ජබ්බා , අම්මාට කීවේය .

'' හා , හොඳයි පරිස්සමින් , '' අම්මා තම අවසරය ලබා දුන් විගසම අපි ගෙයින් එළියට පැන ගත්තෙමු .

'' ඇහුණාද , හවස් වෙන්න කළින් එන්න ඕනා.. '' අම්මා යළිත් කීවාය .

'' හරි අම්මේ '' කියා මම පිළිතුරු දුන්නෙම් ග

අපි ගග බලා පිටත් වුනෙමු . මා හැර අනිත් පස්දෙනාම පාසල් බෑගයද , ජර්ට් හා සපත්තු මේස් ද රැගෙන ගියෝය . පැයක් , දෙකක් ගගෙහි බැස සිටි අපි සවස පහ වන විට එගොඩට ආවෙමු .

'' එහෙනං දැං වේලාව හරි දැං යමු .. '' කියා මම කිවේම් .

'' ඔව් හවස් වුණා '' චරියා ද කිවේය .

ගගෙන් එගොඩ වු අප ගෙවල් බලා පිටත් වුනෙමු . මම ගෙදර විත් ළිදෙන් ද නා , රෑ ඇදුම ඇගලා ගත්තෙම් . අනතුරුව කාමරයට ගියේ පොත්පත් බැලීමටය . කාලය ගෙවී යන්නට වීය . සීයා , අම්මා හා රෑ කෑමට එක්වී පසුව නින්දට වැටුනෙම් .

හයවන පරිච්ඡේදය

උදෑසනම කුකුළාගේ නාදයට ඇහැරුණු මම ඇඳෙන් බැස කුස්සියට ගියෙමි . මා එහි යන විටත් අම්මා කෑම සාදා අහවර කිරීමට ළංව තිබුනාය . මම කෑම බඳුන් ගෙන ඒවා අඩුක් කර තැබීමි .

'' පුතා දැං යන්න , හෝදගෙන එන්න '' අම්මා මට කීවාය .

'' හා '' කියා මම තුවායද රැගෙන ළිඳ ළඟට ගොස් ඇඟපත සෝදා පාසල් යෑමට ලෑස්ති වුනෙමි . ලෑස්ති වී යළිත් කුස්සියට ගියෙමි .

'' ආ , පුතා ලෑස්ති වුනාද ... මේ කිරි එක බීලා කැමති දෙයක් කන්න '' අම්මා මට කීවේ කුස්සිය අස්පස් කරමිනි .

මම කිරි එක බී ලැවරියා දෙකක් කෑවෙමි . පසුව කණ්ණාඩිය අසළට විත් කොණ්ඩය පීරා ෂර්ට් එක යට කර ගත්තෙමි .

'' සයුරයා , වරෙන් යන්න '' තරියා ගේට්ටුව අසළට විත් කෑ ගැසීය .

මම '' මේ එනෝ , '' කියා ගොස් මවට වැඳ '' මම යනවා අම්මේ '' කියා එළියට බැස්සෙමි .

'' හරි පුතේ පරිස්සමින් '' කියා ඇය මා පසුපස ගේට්ටුව දක්වාම ආවාය .

මා හා තරියා යන අතර තුර අනිත් එවුන් අතරින් පතර එක් විය .

අපි පාසලට ළගා වීමු . පන්තියට ගොස් කතා බහ කරන අතරතුර පාසලේ ආරම්භක සීනුව නාද විය . පන්සිල් සමාදන් වී ඉගෙනුම් කටයුතු ආරම්භක කළෙමු . පාසල් විවේක කාලයද අහවර විය . එකවරම පොඩි හාමුදුරුවන් පන්තියට පැමිණියේය . ඒ තවත් ගුරුවරයෙකු සමගය .

'' මේ අපේ අලුත් ක්‍රිකට් ගුරුතුමා... හෙට ඉදන් අප් පාසලේ ක්‍රිකට් පටන් ගන්නවා . මේ පන්තියේ කැමති අයට පුලුවන් කණ්ඩායමට බැඳෙන්න . ඒ සඳහා හෙට සවස සිට තෝරා ගැනීම් සිදුකරනවා . '' යනුවෙන් එතුමා පැවසීය .

'' ඔබතුමාට මොනවා හරි කියන්න තියෙනවනං අවස්ථාව ගන්න ගුරුතුමා '' යනුවෙන් පොඩි හාමුදුරුවන් අසල සිටි ගුරුතුමාට පැවසීය .

'' ඔව් දරුවනේ , ක්‍රිකට් ගහන්න කැමති , හැකි අය හෙට පස්වරු පහ වෙනකං පාසලේ රැඳෙන්න බලාගෙන එන්න . දෙමව්පියන්ගේ කැමැත්ත පළ කරන ලද ලිපියක් රැගෙන එන්නට ඕනා , එහෙනම් ළමයිනේ අපි හෙට හමුවෙමු ආයුබෝවන් '' ඒ ගුරුතුමා කථා කර කීවේය .

ඔවුන් දෙදෙනා එතනින් නික්ම ගිය පසු තර්ක ශාස්ත්‍ර ගුරුවරයා පැමිණ පාඩම කරගෙන ගියේය . පාසලේ අවසාන සීනුව නාද විය .

අපි ගෙවල් වලට යන්නට වීමු . ඒ යන අතර තුර අපට සාරිතාවද ඇගේ මිතුරියන් දෙදෙනාද මුණ ගැසුණි . ඇය මා හා මඳ සිනහවක් පා යන්නට විය . මම සිටියේ ක්‍රීඩා ගුරුතුමා කියූ දේ ගැන කල්පනා කරමින් නිසා මට ඇය හා සිනා සිමට නොහැකි විය .

'' බං , මං මෙතනින් නවතිනවා '' යැයි ජබ්බා කීවේය .

මඳ දුරක් ගොස් දනියාද , චරියාද , නෙවියාද සමුගත්තෝය . අවසානයේ ඉතිරි වුයේ මා හා තරියා පමණි . මමද අපේ ගේ අසලට පැමිණි විට නැවතුනෙමි .

'' එහෙනම් උඹ පරිස්සමින් ආ '' මම තරියාට කීවේමි . ඔහු හිස වනා යන්නට විය .

'' අන්න අරූ එනවා , ඕකා එදා මට කරපු වැඩේට හෙට ඕකා ක්‍රිකට් වලට නවතින්න බෑ '' පදුරක් අසල මුවා වී සිටි ජෙහාන් කීවේය .

'' හරි බං අද ඌ තනියම , මං බලාගන්නං අද ඌව '' උදාර කීවේය .

තරිදු පාර දිගේ නිවස බලා පියමනින්නට විය .

'' ආ මල්ලි , අද තනියම වගේ නේ, '' කියමින් තරිදුගේ පාර හරස් කරමින් පොල්ලක්ද රැගෙන පාර අසල පදුරේ සැගවී සිටි උදාර පාරට පැන්නේය .

'' ඇයි උඹ අහන්නේ තනිය මකන්නද ? '' තරිදු උදාරගෙන් ඇසීය .

'' අපෝ මල්ලි මං විතරක් නෙමෙයි '' කියා උදාර විසිල් පහරක් ගැසීය .

ඒ විසිල් පහරට පොලු රැගත් ෂෙහාන් ඇතුලු ඔවුන්ගේ කණ්ඩායම තරිඳුව වට කර ගත්තේය .

'' අම්මේ මං ආවා '' යනුවෙන් මම අම්මාට කීවේමි .

'' ආ පුතා , මේ තරිඳු පුතා මෙහේ පොතක් දාලා ගිහිල්ලා ඊයේ... '' කියමින් අම්මා මට පොතක් ගෙනවිත් දුන්නාය .

'' අපොයි , මේ දේශපාලන විද්‍යාව පොත , සර් හෙට මේකේ වැඩ කරන් එන්නත් කිවුවනේ '' පොත අතට ගෙන මම කීවේමි .

'' අනේ පුතේ තාම ඒ ළමයා මග වෙන්න ඇති , දුවලා ගිහිල්ලා දීලා එන්නකෝ '' අම්මා මට කීවාය .

'' හා අම්මේ , මං ගිහින් දීලා එන්නම් '' කියා මම පොතද රැගෙන ගියෙමි .

'' ඔන්න උඹේ තනි රකින්න අපි හය දෙනාම ආවා ... '' ජෙහාන් කීවේය .

එවිට තරිඳු සීනා සෙන්නට විය .

'' අඩෝ , ඇයි උඹ හිනා වෙන්නේ '' උදාර මදක් ආවේගයෙන් ඇසීය .

'' ඇයි මට හිනා වෙන්න බැරිද ? දැං උඹලා මට ගහයි කියලා බයේ අඩන්නද කියන්නේ මට '' තරිඳු උදාරගෙන් ඇසිය .

'' දැන්ම අඩන්න එපා බං අපි දැං කරන වැඩේ නිසා උඹට හෙට ක්‍රිකට් කණ්ඩායමට තෝරගන්න වෙලාවට ඉන්න වෙන්නේ නෑ . ඒ වෙලාවට අඩපන් '' රන්සර සීනාසෙමින් කීවේය .

'' අනේ බං මට බයයි ... යන්න දීපන් '' තරිඳු දුක්බරව කියා එකවරම සිනාසෙන්නට විය .

'' අඩෝ , '' කියමින් උදාර තරිඳුගේ ළගට විත් ඔහුගේ කමිසයෙන් අල්ලා ගත්තේය .

එවිට තරිඳු උදාරට වැරෙන් පහරක් එල්ල කළේය . එයින් උදාර කැරකී ගොස් බිම වැටුණි . උදාරගේ තොල පැළී ලේ ගලන්නට විය . එයින් කෝපයට පත් උදාර නැවත නැගිට තරිඳුට මුහුණට පහරක් ගැසීය . තරිඳු නැවත උදාරගේ බඩට කකුලෙන් පහරක් ගැසීය .

'' උඹට මම අද '' කියමින් රන්සර තරිදුට පොල්ලෙන් ගැසීමට පොල්ල ඔසවා ගෙන ඉදිරියට පැමිණියේය .

රන්සරගේ පොල්ල අල්ලා ගත් තරිදු ඔහුටද කකුලෙන් පහරක් ගැසීමට සූදානම් විය .

නමුත් ජෙහාන් අසළ සිටි දසුන් හා සමන් පොලු දෙක බිම දමා තරිදුගේ පිටුපසින් ගොස් ඔහුගේ අත් දෙක පිටු පසට තබා තදික් අල්ලා ගත්තෝය . එවිට ජෙහාන් සිනා සෙමින් තරිදු ඉදිරියට පැමිණියේය .

'' උඹ අර අනාථයා ලොකු කරන් , මේ මාත් එක්ක හැප්පෙන්න ආවනේ '' තරිදුගේ කමිසය අල්ලා ගත් ජෙහාන් ඇසීය .

'' කාටද යකෝ අනාථයා කියන්නේ ? '' තරිදු ඇසීය .

'' උඹේ කට වැඩියි '' කියා උදාර තරිදුගේ කම්මුලට පහරක් ගැසුවේය .

'' උඹ කාටද ගැහුවේ '' කියා උදාරගෙන් තරිදු ඇසීය .

එවිට යළිත් වරක් අත මිටි මොළවා උදාර තරිදුගේ මූහුණට ගැසුවේය . තරිදුගේ තොල පැළී ලේ ගලන්නට විය . තරිදු කකුලෙන් නැවත උදාරට පහරක් ගැසුවේය . එවිට ජෙහාන් පැමිණ තරිදුගේ බඩට වැරෙන් පහරක් ගැසුවිට රන්සර හා උදාරද එයට එක් වී තරිදුට වැරෙන් පහර දෙන්නට විය

තරිදුට කිසි දෙයක් කරකියා ගන්නට නොහැකි විය . මන්ද යත් දසුන් හා සමන් ඔහුගේ දෑත් තදින් අල්ලා සිටීම නිසාය . ඔවුන් තිදෙනා තරිදු අඩපණ වන තුරුම ඔහුට පහර දෙන්නට විය .

අවසානයේ තරිඳු බිම වැටුණි . එවිට ජෙහාන් උදාරට හා රන්සරට ,

'' එදා මූ මගේ අත පණ නැති වෙනකං නාඩිය අල්ලන් හිටියා... අර පොල්ල අරන් මුගේ අත කඩපන් ආයේ කිසි දෙයක් කරන්න බැරි වෙන්නම..... රන්සර මූගේ අත දිග ඇරලා අල්ලපන් '' කියා කීවේය .

රන්සර තරිඳුගේ අත දිග හැර ඇල්ලුවේය . උදාර පොල්ල ගෙන එයින් ගැසීමට පොල්ල එසවුයේය . තරිඳු දෑස් පියා ගත්තේ මේ පාලු පාරේ තමාව බේරා ගැනීමට කිසිවෙකු නොමැති නිසාය . උදාර කෑ ගසමින් පොල්ලෙන් පහර දුනි .

නමුත් එය තමාට නොවැදීම නිසා තරිඳු දෑස් හැර බැලිය .

'' සයුර උඹ , '' තරිඳු ඉබේම කීවේය .

මම උදාරගේ පොල්ල අල්ලා එය ඇද විසි කළෙමි . පසුව ඔහුට පහරක් එල්ල කර රන්සරටද පහරක් එල්ල කළෙමි . පසුව තරිඳුව නැගිට විමි .

'' ආහ් , උඹත් ආවද ? '' කියා ජෙහාන් මට පහරක් ගැසීමට උත්සහ කළ නමුත් මම එයින් බේරී අනතුරුව ඔහුගේ අත පිටුපසට ඇද ඔහුටද ගැසුවෙමි . මඳ වේලාවක් ගුටි බැට හුවමාරු විය .

පසුව ජෙහාන් ඇතුලු ඔහුගේ පිරිස පැන දිවිවේ ක්‍රිකට් කෝච් මොටර් බයිසිකලයෙන් පැමිණෙනු දුටු නිසාය . එතුමා අප සිටි තැන බයිසිකලය නැවැත්වීය .

'' මොකද , මොකද මේ වුනේ , කවුද අර පැනලා දිව්වේ '' කෝච් සර් මොටර් බයිසිකලයෙන් බැස ඇසුවේය .

'' මගේ යාලුවට ගහපු අය සර් , තව පොඩ්ඩෙන් අත කඩනවා මෙයාගේ '' මම කෝච් සර් පිළිතුරු දුන්නෙමි .

'' අත කඩන්න , ඒ ඇයි ඒ '' කෝච් සර් ප්‍රශ්න කළේය .

'' හෙට ක්‍රීකට් කණ්ඩායමට තෝරගන්න තරගයෙන් අපි තෙරේයි කියලා සර් '' මම නැවත පිළිතුරු දුන්නේමි .

'' ඉතින් , කවුද ඒ '' සර් නැවත ප්‍රශ්න කළේය .

'' ඒ ෂෙහාන් , සර් ග්‍රාමසේවකගේ පුතා . එයාලා අපි එක්ක තරහයි '' මම පිළිතුරු දුන්නෙමි .

'' ආහ් එහෙමද ? '' කෝච් සර් ඇසීය .

'' ඔව් සර් '' මම කීවේමි .

'' එහෙනං මේ පුතාව දැං ගෙදර ගෙනිහින් දාන්න වෙයි නේද ? '' කෝච් සර් ඇසීය .

'' ඔව් සර් මං ගෙනිහින් දානවා '' මම කීවේමි .

'' පුතාලට ආමාරුවක් නෑනේ '' සර් යළිත් විමසුවේය .

'' නෑ.. නෑ සර් '' තරීදු පිළිතුරු දුන්නේය .

'' ආ , දෙන්නම නගින්න , මං ගෙවල් වලට ගිහින් දාන්නම් '' කෝච් සර් අපට කීවේය .

'' අනේ සර් කරදරයක් නේද ? '' මම ඇසුවේමි .

එවිට කෝච් සර් '' නෑ, නෑ නගින්න '' කියා මෝටර් බයිසිකලය පණ ගැන්විය .

තරිඳුව මුලින් නග්ගවා මම පිටුපසින් නැග්ගෙමි .

'' මම කියලා තීනවා උඹට උන් එක්ක පැටලෙන්න එපා කියලා... බලනෝ හොඳ වෙලාවට මම එතනට ආවේ '' මම තරිඳුගේ කණට කර කීවේමි .

'' මං පාරේ යද්දී උන් වට කරේ බං . මං පැටලෙන්න ගියේ නෑ '' තරිඳු මට කීවේය .

'' හා , ඒක තමා කියන්නේ එදා අතට මොනවත් කරේ නැත්තම් , මේ මුකුත් නෑනේ . '' මම නැවත පිළිතුරු දුන්නෙමි .

'' හරි බං මුකුත් වුනේ නෑනේ '' තරිඳු නැවත කීවේය .

'' ඔව්.. ඔව් වුනේ නෑ '' මම කීවේමි .

කතාවෙන් කතාව තරිඳුලාගේ ගෙදරට ලංවිය .

'' සර් , ඔන්න ඔය ඉස්සරහා ගෙදරින් නවත්තන්න '' මම කෝච් සර්ට කීවේමි .

මොටර් බයිසිකලය ගේ අසල නැවැත්වූ පසු මම බැස තරිඳුවද බැස්සුවෙමි .

'' හරි සර් , බොහෝම ස්තූතියි . '' තරිඳු සර්ට කීවේය .

එවිට තරිදුගේ මව එළියට විත් ,

'' මේ මොනා වේලාද පුතේ ? '' තරිදුගේ මුහුණ අල්ලමින් ඇසුවාය .

'' ආ මේ අලුත් ස්කොලේ මහත්තයා නේද ? එන්න මහත්තයෝ ඇතුළට '' තරිදුගේ මව සර් දුටු සැටියෙම කීවාය .

සර් බයිසිකලයෙන් බැස , තරිදුලාගේ ගෙදරට ඇතුලු විය . මමද තරිදුද ගුරුතුමාද නිවසට ගොස් පුටු වල අසුන් ගත්තෙමු .

'' දුවේ , තාරිකා... ඔය ලිපේ කේතලේට වතුර ටිකක් තියලා ගනින්... සර්ටයි , සයුර පුතාටයි තේ ඩිංගක් හදලා දෙන්න '' තරිදුගේ මව , අක්කාට ඇසෙන පරිදි කීවාය .

'' ආ , හරි අම්මේ '' කුස්සියේ සිට අක්කා උත්තර දුන්නාය .

'' තොල ටිකක් පැලිලා වගේ නේද ? '' සර් තරිදුගෙන් ඇසීය .

'' අපෝ තොල පැලිලා බේරුණා මදැයි . ඕන වෙලේක කා එක්ක හරි පැටලෙනවා '' තරිදුගේ මව සර්ට කීවාය .

'' සර්ගේ ගම් පළාත එහෙම... ළගදිද ගුරු පත්වීම ලැබුනේ ? '' මව සර්ගෙන් ප්‍රශ්න කළාය .

'' මම කටුවානේ... දැනට අවුරුදු පහක් විතර වෙනවා ක්‍රීඩා පුහුණුවීම් ගුරුවරයෙක් විදියට පත්වීම අරන්.. මේ ඉස්කෝලෙට මාරුවෙන්න කලින් කොළඹ රාජකීයේ තමා හිටියේ '' කෝච් සර් මවට පිළිතුරු දුන්නේය . එවිට තාරිකා අක්කා තේ රැගෙන විත් අපට ඇල්ලුවාය .

'' දුවේ , ඔන්න වෙනිවැල් ගැට ටිකක් ළිපට තියපන් , මල්ලිට දෙන්න '' තරිදුගේ මව යළිත් අක්කාට වැඩක් පැවරුවාය .

'' තරිදුලාගේ අම්මේ ගිහින් එන්නං , තරිදුව ක්‍රීකට් වලට එවන්න කැමති නං හෙට එයා අතේ ලිපියක් එවන්න '' කියා තේ කෝප්පයද රැගෙන කෝච් සර් නැගිට්ටේය .

'' ආ , හරි සර් '' කෝච් සර්ගේ අතේ තිබු තේ කෝප්පයද රැගෙන මව පිළිතුරු දුන්නාය .

'' මාත් යනවා නැන්දේ , '' මමද තේ කෝප්පය නැන්දාට දුන්නෙමි .

'' හොදයි පුතේ '' නැන්දා පිළිතුරු දුන්නාය .

එවිට කෝච් සර් '' සයුරලගේ ගෙවල් තීන්නේ හංදියට ටිකක් මෙහයින් නේද ? '' කියා මගෙන් ඇසුවේය .

'' ඔව් සර් '' මම පිළිතුරු දුන්නෙමි .

'' මාත් ඒපැත්තෙන් තමා යන්නේ , යමු මාත් එක්කම '' ගෙයින් එළියට බැස විත් මට කෝච් සර් කීවේය .

'' හා සර් , යමු '' මමද ඊට එකඟ වුනෙමි .

මම කෝච් සර් හා මෝටර් බයිසිකලයෙන් නිවසට ගියෙමි . නිවස අසලටම ඇරලවා කෝච් සර් යන්නට විය .

'' හෙට හවස ඉන්නවනං අම්මගෙන් ලියුමක් අරන් එන්න '' කියමින් කෝච් සර් පිටත් විය .

'' හොදයි සර් '' කියා මමද ගෙට ඇතුලු වුනෙමි .

'' කව්ද පුතේ ඒ ආවේ... '' අම්මාද එළියට බැස ඇසුවාය . එවිට කෝච් සර් ගොස් හමාරය .

'' අලුතෙන් ඉස්කෝලෙට ආපු ක්‍රීකට් ගුරුතුමා අම්මේ , දැං නං බඩගිනියි '' කියමින් මම ගෙට ඇතුලු වුනෙමි .

'' බත් එක මේස උඩ කූඩෙන් වහලා ඇති පුතේ... කන්න ඉස්සෙල්ලා ඇගපත සොදගෙන හිටියනං හරි නේද ? '' අම්මා මට කීවාය .

මම එවිට තුවායද රැගෙන ළිදට යෑමට සූදානම් වුනෙමි .

'' මං කඩේට යනවා හවස් වරුවේ වේළදාමට , සීයා කාමරේ නිදි... ගේ බලා ගෙන ඉන්න '' කියා අම්මා කුස්සියට ගියේ සදාගත් කෑම ගැනීමටය .

'' අම්මේ දැං බත් කන්න බෑ . මටත් ඔය හදපු එවයින් මොනාහරි තියලා යන්න '' කියා මම කීවේමි .

අම්මා කඩයට පිටත් විය . මම ඇගපත සෝදා ගෙට වුනෙමි . තාලය ගෙවි යන්නට විය .

අම්මා නැවත ගෙදර ආවාය . ඇය ළිදට ගොස් ඇගපත සෝදා ගෙට ආවාය .

'' අම්මේ , හෙට මං එන්න ටිකක් හවස් වෙයි '' මම අම්මාට කීවේමි .

'' ඒ මොකද පුතේ අමතර පන්ති ද ? '' අම්මා ඇසුවාය .

'' නෑ අම්මේ , හෙට ක්‍රිකට් කණ්ඩායමට තෝරගන්නවා . ඒකට '' මම කී විට එකවරම අම්මා ,

'' නෑ ... නෑ ක්‍රිකට් ඕන නෑ ඔයාට '' මදක් ආවේගයෙන් කීවාය .

'' උබ මොකද එහෙම කියන්නේ , කොලුවා ක්‍රිකට් වලට ආසයි , දක්ෂයි කියලා අමතක වුනාද ? '' සීයා එකවරම ඇසුවේය .

'' ඔව් අම්මේ මගේ හීනේ ක්‍රිකට් නේ '' මම අම්මාට කීවේමි .

'' නෑ , නෑ කවුරුත් ක්‍රිකට් ගහන්නේ නෑ එච්චරයි . ආයේ ඔය ගැන කතා කරන්න ඕන නෑ '' අම්මා එකවරම කුස්සියට ගියාය . මම ඇගේ පිටුපසින් ගියෙමි . ඇය කුස්සියට ගොස් අඩන්නට විය .

'' අනේ අම්මේ , අඩන්න එපා මම ක්‍රිකට් වලට යන්නේ නෑ '' කියා මම කාමරයට ගොස් ඇඳට වැටුනෙමි . නොදැනීම මට නින්ද ගියේය .

'' ඇයි උබ කොලුවට ක්‍රිකට් ගහන්න දෙන්නේ නැත්තේ '' සීයා අම්මාගෙන් ඇසීය .

'' එයත් එයාගේ තාත්තා වගේ වෙන්න ඕන නැති නිසා . '' අම්මා පිළිතුරු දුන්නාය .

'' කොල්ලගේ අනාගතේ උඹගේ අතීතේ නිසා නැති කරලා දාන්නද හදන්නේ ? මං හිතුවේ නෑ දුවේ උඹ ඔහොමයි කියලා '' සීයා නැවත කීවේය .

'' එදා ක්‍රිකට් අවසන් තරගෙට ගියා ගියාමයි . එයා තාමත් ගෙදර ආවේ නෑ . මං අදටත් බලන් ඉන්නවා එයා එනකං . මං කැමති නෑ , කවදා හරි දවසක මං වගේ තව ගෙනෙක් මගේ කොල්ලා එනකල් මේ විදියට බලන් ඉන්නවට '' අම්මා නැවත කීවේ අඩමිනි .

'' උඹ කොල්ලට යන්න දෙන්නම ඕනා . නැත්තම් උඹ කොලුවට පෙන්නලා තීන්නේ බොරු ආදරයක් '' කියා පවසමින් සීයා කාමරයට ගියේය .

පසුදා පහන් විය . මම උදෑසනම නැගිට පාසල් යෑමට සූදානම් විය .

'' පුතා , කිරි එක බීලා එන්න '' කියා පවසමින් අම්මා ද ළිඳ ළගට ගියාය . මම ඒ ගැන වැඩි සැලකිල්ලක් නොදැක්වුවෙමි .

'' සයුරයා , වරෙන් '' කියා තරිඳු වැට ළගට විත් කෑ ගැසීය .

'' මේ එනවා බං '' කියමින් මම ගෙදරින් එළියට බැස්සෙමි .

'' උඹ අද හවස ඉන්න කෑම එක ගත්තා නේද ? '' තරිඳු මගෙන් ඇසිය .

'' මං ඉන්නේ නෑ බං '' කියා මම කියන විටම ,

'' ආ මෙන්න කෑම '' කියා අම්මා මට පාර්සල් දෙකක් ගෙනවිත් දුන්නාය .

'' දෙකක් මොකටද ? '' මම ඇයගෙන් ඇසුවෙමි .

'' හවස ඉන්නත් එක්ක , ආ මෙන්න ලියුම '' කියා සිනා මුසු මුහුණින් අම්මා මගේ අතමත ලියුම තැබුවාය . මමද සිනාසී එය ගෙන පාසල් පිටත් වුනෙමි .

හත්වන පරිච්ඡේදය

පාසල අවසාන විය . දහවල් ආහාරය ගෙන අපි පිට්ටනියට බලා ගියෙමු . පිට්ටනියේ ගුරුතුමා සිටිනු දුටු අපි පස්දෙනා කෝච් සර්ට ලියුම් දුන්නෙමු .

'' කෝ ජනිත්ට ගෙදරින් කැමැත්ත දුන්නේ නැද්ද ? '' ජනිත් ලියුමක් නොදුන් නිසා කෝච් සර් ඇසුවේය .

'' සර් මං මීඩියා කල්බ් එකේ ... මං හිතන් ඉන්නේ තරග නිවේදකයෙක් වෙන්න . '' ජනිත් පිළිතුරු දුන්නේය .

'' හොඳ අදහසක් , දැං ඉලක්කයට යන්න මාර්ගය හදාගෙනද තියෙන්නේ '' කෝච් සර් ජනිත් ගෙන් ඇසීය .

'' ඔව් සර් හදාගෙන යනවා '' ජනිත් පිළිතුරු දුන්නේය .

'' උදව්වක් ඕන වුනොත් දෙපාරක් හිතන්නේ නැතුව මාව හම්බෙන්න හරි '' කෝච් සර් ජනිත්ගේ පිටට තට්ටු කරමින් කීවේය .

'' හරි සර් '' ජනිත් කීවේය .

'' එවිට ෂෙහාන්ද , දසුන්ද , උදාරද , රන්සරද පැමිණ කෝච් සර්ට ලියුම් දුන්නෝය .

'' හරි කොල්ලනේ , එහෙනං අපි පටන් ගමු '' කියා කෝච් සර් විසිල් හඬක් නිකුත් කළේ බෙල්ලේ දමා තිබූ විසිල් පිඹිනය රැගෙනය . අපි සියලු දෙනා ගුරුතුමා ඉදිරියෙන් අඩකවයක් ආකාරයට සිටගත්තෙමු .

'' ඔයාලා ක්‍රීකට් කියන එක ගැන දන්නවා කියලා හිතනවා . නැෂනල් ටීම් යන්න බලාගෙන සෙල්ලම් කරන කට්ටියම මෙතන ඇති . එහෙනම් කොල්ලනේ අපි වැඩේ පටන් ගමු . '' සර් එසේ කී පසු අපි අපේ දක්ෂතා පෙන්වීමට පටන් ගත්තෙමු .

'' කොල්ලනේ දැං මෙහෙ එන්න ල වේලාව හරි '' කියා කෝච් සර් නැවත විසිල් හඬ පිම්බෙය . යළිත් ගුරුතුමා අපට මෙසේ කීවේය .

'' ඉන්න ඔක්කෝම දක්ෂයෝ , කණ්ඩායමට මම විසිදෙනෙක් තෝරගත්තා . මෙන්න මේ අය තමා ඒ අතර වෙන්නේ . යනුවෙන් සර් නම් කීමට පටන් ගත්තේය . ඒ අතර අපි පස්දෙනාම විය . ෂෙහාන් , දසුන් හා උදාරගේ නම්ද එහි විය .

'' හරි එහෙනං මේ කට්ටියම හෙට ප්‍රැක්ටිස් එද්දි ක්‍රිකට් බඩු අරන් එන්න ඕනා . දැං ගෙවල් වලට යන්න හැකි '' කියා කෝච් සර් පිට්ටනියෙන් ඉවත්ව ගියේය . අපිද ගෙවල් වලට පිටත් වීමට පාරට ගියෙමු .

අතරමගදී ,

'' මොකෝ බං අවුලෙන් '' තරිදු මගෙන් ඇසීය .

'' නෑ බං , හෙටම ක්‍රිකට් බඩු ටික ගන්නේ කොහොමද කියලා බැලුවේ , '' මම කිවේමි .

'' ඒකත් ඇත්ත . අම්මගෙන් අහලා බලපන් '' දනියා මට කීවේය .

'' හ්මි ... මට ඉතින් අම්මා විතරනේ ඉන්නේ කොහොමත් '' කියා මම දිග හුස්මක් ගත්තෙමි .

ගෙදරට ළගාවිය .

මම '' එහෙනං යනවා බං '' කියමින් ගෙට ගියෙමි .

කාලය ගෙවී යන්නට විය . අම්මාද කඩේ සිට ගෙදරට පැමිණ පිරිසිදු වීමට ළිදට ගියාය .

ඇදට වී '' අම්මට කොහොමද කියන්නේ ? '' කියා මම මගෙන්ම විමසුවෙමි .

එවිට අම්මා මගේ කාමරයට ආවේ මා හට රෑ කෑමට එන්නට කීමටය .

'' මොකෝ පුතේ , මොකක් හරි ප්‍රශ්නයක්ද ? '' මගේ මුහුණ දුටු විගසම අම්මා ඇසුවාය .

'' නෑ අම්මේ '' මම පිළිතුරු දුන්නෙමි .

'' අද කොහොමද , ඔයාව තේරුණා නේද ? '' අම්මා මගෙන් ඇසුවාය .

'' ඔව් .. ඒත් වැඩක් නෑ අම්මේ , හෙට එද්දි ක්‍රිකට් බඩු අරන් එන්න කිවුවා . මම ආයේ යන්නේ නැ අම්මේ ... මේ හදිස්සියේ කොහොමද ඒවා ගන්නේ '' මම අම්මාට කීවේම් .

'' අනේ , ලොකු ගානක් යයි නේද පුතේ '' අම්මා කිවාය .

'' ඔව් අම්මේ ... දවස් දෙක තුනක් මග ඇරලා හිටියම සරි වෙන ගෙනෙක්ව තෝර ගනී .

'' ඒත් පුතේ , '' අම්මා යමක් කියන්නට සැරසෙද්දී ,

'' නෑ අම්මේ ඕන නෑ , '' කියා මම කිවේම් .

'' එන්න කෑම කමු එහෙනං '' අම්මා යළිත් කීවේ ඇදෙන් නැගිටින අතරය .

'' බෑ අම්මේ , කන්න බෑ දැං '' මම අම්මාට කීවෙම් .

'' අනේ පුතේ , '' අම්මා කියන්නට විය .

'' අම්මලා කන්න , මට අද මහන්සියි '' කියා මම ඇදේ අනිත් අතට හැරුනෙම් .

අම්මා කාමරයෙන් පිටත් වන්නට විය .

'' පොලීසට ගන්නවත් තැනක් නෑනේ .. මේ වෙලාවේ , '' අම්මා සීයා හා සාකච්ඡා කරන්නට විය .

ඒ අතර ක්‍රිකට් පුහුණුකරු තමාට ලැබුණු ලියුම් කියවීමට පටන් ගත්තේය .

'' මේ අකුරු... ගොඩක් පුරුදුයිනේ , කවුද මේ ලියුම දුන්නේ '' ලියුමක් අතේ තබා ගෙන ඔහු කල්පනා කරන්නට විය .

'' මේක දුන්නේ සයුර , ඔව් මේ තියෙන්නේ නමත්... ඒත් මේ අකුරු ගොඩක් පුරුදුයි වගේ දැනෙන්නේ ඇයි ? සයුරගේ අම්මා මගේ යාලුවෙක් වත්ද '' ඔහු තනියම සිතන්නට විය .

'' සරි කෑම ලෑස්තියි '' ඔහු කුලියට නැවති සිටින ගෙදර හිමිකරු ඇවිත් කීවේය .

'' හරි , මං එන්නම් ... '' ඔහු පිළිතුරු දුන්නේය .

මදක් කල්පනා කිරමෙන් අනතුරුව ,

'' අනේ මන්දා , හොදටම පුරුදුයි මේවා ...'' කියා ලියුම මේසයට තබා කෑම කෑමට පිටත්ව ගියේය .

කුකුළා හඬලන්නට විය . ඉර පහන් විය නමුත් අද මා ඇදෙන් බැස්සේ නැත . මන්ද යත් , ක්‍රීකට් මග හැරීමට වුවමනා නිසාය .

'' පුතා ලෑස්ති වෙන්න... ඉස්කොලේ යන්න පරක්කු වෙනවා .. '' අම්මා කාමරයේ දොර අසලට විත් මට කීවාය .

'' අද ගෙදර ඉන්නවා අම්මේ ..... '' මම පිළිතුරු දුන්නෙමි .

'' කෝ , එන්න .. ඇවිත් බලන්න මේ මොනවද තියෙන්නේ කියලා '' අම්මා යළිත් කියන්නට විය .

එවිට මම ඇදෙන් බැස , ගියෙමි .

'' කොහෙන්ද අම්මේ මේවා ... අනේ තවත් ණය වුනාද ? '' එකවරම මේසය උඩ තබා තිබූ ක්‍රීකට් බඩු දුටු මම ඇසුවෙමි .

'' සල්ලි නං ණයට තමා ගත්තේ , පස්සේ ගෙවන්න බැරියැ... කෝ දැං ගිහින් ඉක්මනට ලෑස්ති වෙන්න . මං ඔය ටික බෑග් එකට දාන්නම් '' අම්මා මගේ හිස අතගාමින් කීවාය .

මම සිනාසී එතනින් පිටව ගියේ ඇයගේ සෙනෙහස ගැන සිතමිනි . එය ගැන සිතීම මගේ පුංචි සිත තුළ කල නොහැක්කකි . මන්ද යත් ඇගේ සෙනෙහස සාගරයක් තරමිය . මම එසේ සිතමින් ළිද අසලටම ගියෙමි .

'' මොනාද දුවේ ඔය ක්‍රිකට් බඩු දිහා බලාගෙන හිතන්නේ ? '' සීයා අම්මාගෙන් ඇසීය .

එකවරම ගැස්සී ගිය ඇය කදුලු පිසදමා ,

'' මුකුත් නෑ තාත්තේ '' කියා පිළිතුරු දුන්නාය .

'' අවුරුදු දහඅටක් වෙන්නත් ළගයි , උබ තවමත් ඌ ගැන හිතනවා නේද ? '' සීයා අම්මාගෙන් ඇසීය .

'' කොහොම අමතක කරන්නද තාත්තේ .. මේ බඩු දැක්කම මතක් වෙන්නේ ඉස්සර එයා පුහුණුවීම් ඉවර වුනු ගමන්ම මාව බලන්න එන විදිය . '' අම්මා ක්‍රිකට් බඩු බෑගයට දමන අතර අඩමින් කීවාය .

'' මං ඒ ගැන නොදන්නවා නෙමෙයි පුතේ .. ඒත් ඌ දැං වෙන කොහේ හරි සන්තෝසෙන් ඇති . උඹ මෙහේ තාමත් දුක්විදිනවා . අනික අපි අපේ ගම අතහැරලා ආවේ ගම්මුන්ගේ කතා ඉවසන්න බැරි නිසානේ . නැත්තං අපි කොහොම හිටපු අයද ? '' සීයා අම්මාට කීවේය .

'' ඒත් මගේ හිත තාම කියනවා එයා තාමත් මාව හොයනවා ඇති කියලා . '' අම්මා සීයාට පිළිතුරු දුන්නාය .

'' ඔන්න කොල්ලා එනවා , කදුලු පිහිදගනින් '' සීයා මා දුටු විගස අම්මාට හෙමින් කීවේය .

කාලය ගෙවී යන්නට විය . අපි පාසල් ගියෙමු . පාසල් ඉගෙනීම් කටයුතු අහවර වී පුහුණුවීම් පටන් ගත්තේය .ජ්බ්බාද පුහුණුකරු අසල සිටියේය . කාලය නොදැනීම ගෙවී ගොස්ය .

අනතුරුව අපි ගෙවල් වලට ගියෙමු . යන අතරතුර අපට සාරිතාව හා ඇගේ මිතුරියන්ව මුණ ගැසුණි , ඇය අමතර පන්ති ගොස් එන වෙලාව මෙය විය . එමනිසා සැමදාම පුහුණුවීම් අවසානයේ සාරිතා අප හා එක් විය ..

එක් දිනක් මා තනිවම පුහුණුවීම් සිදුකරන්නට වුයේ ජ්බ්බා මීඩියා කල්බ් සිටීම නිසාය . එවිට එතනට පුහුණාකරු පැමිණියේය .

'' සයුර , මොකෝ අද ගෙදර යන්නේ නැද්ද ? '' ඔහු මගෙන් විමසුවේය .

'' යනවා සර් .. අද ජනිත් මීඩියා කල්බ් නේ , එයා එනකල් ඉන්නවා . '' මම පිළිතුරු දුන්නෙමි .

'' සයුරගේ ගෙදර කවුද ඉන්නේ , කැමති නං මට විස්තර ටිකක් කියන්න .. '' සර් මට කීවේය .

'' ඉන්නේ , අම්මයි මායි සීයයි තමා . අම්මා හංදියේ කෑම කඩයක් කරනවා . ඒකෙන් තමා අපි ජීවත් වෙන්නේ . '' මම පිළිතුරු දුන්නෙමි .

'' ඔව් හංදියේ එක නේද ? එකෙන් තමා හැමදාම මං ඉන්න ගෙදර අයිති කාරයා කෑම අරන් එන්නේ . කෑම රහයි . '' සර් කීවේය .

'' ඔව් , '' මම හිස වැනුවෙමි .

'' එතකොට සයුරගේ තාත්තා එහෙම '' ගුරුතුමා යළිත් ඇසුවේය .

'' මගේ තාත්තව නං මං දැකලා වත් නෑ සර් , අම්මාගෙන් පොඩි කාලේ අහලා තියෙනවා . මගේ තාත්තත් ක්‍රිකට් සෙල්ලම් කරපු ගෙනෙක් . එච්චරයි මං දන්නේ , තාත්තා ගැන අහපු හැම වෙලේම අම්මා ඇඩුවා . ඉතින් මං ආයේ අම්මගෙන් ඒ ගැන අහන්න ගියේ නෑ . මගේ අම්මා අදටත් බලන් ඉන්නවා මගේ තාත්තා එනකල්... සර් ගැන කිවුවොත් ? '' මම පිළිතුරු දි සර්ගෙන් ප්‍රශ්න කළෙමි .

'' මම නැෂනල් ටීම් සෙල්ලම් කරපු ගෙනෙක් , මං ගෙනෙක්ට ගොඩක් ආදරේ කළා , විවාහ ගිවිස ගෙනත් හිටියේ .. ඉන්දියාවත් එක්ක අවසන් මහා තරගය තිබ්බේ මීට අවුරුදු දහඅටකට ඉස්සෙල්ලා අද වගේ දවසක . ඉන්දියාවට ඉතුරු වෙලා තිබ්බේ ලකුණයි අන්තිම ඕවර් එකට . අන්තිම කඩුල්ල තිබබේ . ඒත් එදා අපි දින්නා . දිනලා පහුවදා අපේ ටීම් එක ලංකාවට ආවා . මං කෙළින්ම යන්න පිටත් වුනේ එයාගේ ගෙදරට . හැබැයි හිතපු නැති රීය අනතුරකට මම මුහුණ දුන්නා . මාස ගාණක් මං රෝහලේ හිටියේ . පස්සේ රෝහලෙන් වාර්තාව නිකුත් වුණා මට අතේ අබාධයක් නිසා ආයේ සෙල්ලම් කරන්න බෑ කියලා . මං ඒකත් අරන් එයාලගේ ගෙදර ගියා .

ඒත් එයාලා හිටියේ නෑ . එයාලගේ අසල්වාසියෙක් කිවුවා එයාලා මේ ගෙවල් අතහැරලා ගියා කියලා . මං එයාලව ගොඩක් තැන් වල හෙව්වා . හැබැයි තවම හම්බ වුණේ නෑ. අදටත් මං එයාලව හොයනවා . '' සර් කියාගෙන යන්නට විය .

'' එයාලව කිවුවේ සර් .. ඒ පවුලේ කීදෙනෙක් හිටියද ? '' මම ඇසුවෙමි .

'' හිටියේ එයයි තාත්තයි විතරයි .. '' ඔහු යළිත් කීවේය .

'' අයියෝ , සර්ට වෙලා තියෙන්නෙත් අපේ අම්මට වෙලා තියෙන දේ වගේම දෙයක් '' මම කිවේමි .

'' සයුරගේ අම්මගේ නම මොකද්ද ? '' සර් මගෙන් විමසීය.

'' මගේ අම්මගේ නම අ.. '' මං කියන්න හදද්දිම ,

'' සයුර දැං යං '' කියා ජබ්බා කෑ ගැසීය .

'' හා .. මේ එනෝ .. '' කියා මම පිළිතුරු දුන්නෙමි .

'' හා එහෙනං යන්න .. '' සර් මට පිටට තට්ටු කරමින් කීවේය .

අපි දෙදෙනා පිටත් විය . මගදි අපට සාරිතාද එක් විය .

'' අද වගේ දවසක ගිය ඔයා තාම ගෙදර ආවේ නැ '' අම්මා පින්තූරයක් දෙස බලාගෙන කීවාය .

මම එවිට ගෙට ඇතුලු වුනේ ,

'' ඇයි අම්මේ අද කඩේ ගියේ නැද්ද ? '' යනුවෙන් අසමින්ය .

'' නෑ පුතේ , ගිහින් ආවේ '' අම්මා කීවාය . මම සෝදා කෑම කා නින්දට වැටුනෙමි ...

මෙලේස දින සති මාස ගෙවී යන්නට විය . කණ්ඩායමේ අනිත් ක්‍රීඩකයින්ට වඩා ගුරුතුමා හා මා අතර දැඩි සම්බන්ධතාවක් ගොඩනැගිණි . මව කොයි තරම් සෙනෙහස දැක්වුවත් ඇයට මගේ පියාගේ අඩුව පුරවන්නට නොහැකි විය . මන්ද යත් දෙවියන් දෙමව්පියන් දෙදෙනෙකු මවන්නේ දෙදෙනාගේ ආදරය අවැසි නිසාය . නමුත් ගුරුතුමා නිසා මට ඒ අඩුව නොදැනී යන්නට විය . ගුරුවරයෙක් වුවත් ඔහු මට පියෙකු හා සමාන වන්නට විය .

අටවන පරිච්ඡේදය

එක් දිනක් පුහුණුවීම් අවසානයේ කෝච් සර් අපව විශේෂ කරුණාකට කැඳවීය .

'' කොල්ලනේ , අපේ පළවෙනි මැච් එක අනිද්දට තියෙනවා . මුලින්ම පාසල් අතර ඉටපස්සේ දිස්ත්‍රික්ක .. ඔය විදියට සමස්ත ලංකා යන්න පුලුවන් . විදුහල්පතිතුමා අවසර දුන්නා . මං හිතනවා දැං ඔයාලා හොඳටම සුදානම් කියලා . එහෙනං හෙට දවසේම ප්‍රැක්ටිස් ලමයි . මාස හයක් අපි පුහුණුවීම් කරා මං දැං ඔයාලව හොඳට අඳුනනවා . ඒ නිසා මං අදත් හිතලා , මේ කණ්ඩායමේ නායකයව හෙට දැනුම් දෙන්නං . එහෙනං හෙට හම්බවෙමු '' කියා ඔහු පැවසීය .

අපි යන අතරමග ,

'' වෙන කවුරු නායකයා වෙන්නද , අපේ සයුරයා ඇරෙන්න '' තරියා මට කීවේය .

'' අන්න හරි '' නෙවින්ද ඊට එක් විය .

මම සීනාසුනෙම් . අදත් වෙනදා මෙන්ම සාරිතාව මූණගැසිණි .

'' ආ උඹලා දෙන්නා කතා කරගෙනම වරෙන් , අපි ඉස්සරහයින් යන්නං '' ජබ්බා සීනාසෙමින් කීවේය .

'' අනේ බං මේ '' මමද සීනාසෙමින් කීවේම් . අපි කතා කරමින් නිවෙස් වලටම ගොස් සමුගත්තෙමු .

'' තාත්තේ , ක්‍රිකට් කෝච් එක්ක ටිකක් කතා කරන්න ඔයා '' ජෙහාන් තම පියාට කීවේය .

'' මොකටද '' බුලත් හපමින් ඔහුගේ පියා ඇසීය .

'' හෙට කාණ්ඩායමේ නායකයා තෝරනවා . ඉතින් ගිහින් මං ගැන කතා කරලා එන්න . '' ජෙහාන් කීවේය .

'' ඒ මොකටද කතා කරන්නේ , ඔයා දක්ෂ නම් ඔයාව තෝරගනී '' සාරිතා දොර උලුවස්සට හේත්තු වී කීවේය .

'' ආ , මේ ඔයා මැද්දට පනින්න එපා හා... මං දක්ෂයි කියලා මං දන්නවා . ඒත් අර හිගන කොල්ලා සරිට ගොටු දානවනේ '' ජෙහාන් කීවේය .

'' කවුද දැං හිගන කොල්ලා ? '' සාරිතා ඇසුවේය .

'' අර ඔයා තැන තැන හම්බෙන්නේ .. අන්න ඌ '' ජෙහාන් කීවේය .

'' අනේ මේ අයියේ .. '' සාරිතා පිළිතුරු දුනි .

'' ඇයි දැං ඒක බොරුද ? මට උදාරයා කිවුවා තමුසේ ඒකව හම්බෙනවා කියලා . මං මේ ඇස් දෙකට තාම දැක්කේ නෑ .. හැබැයි දැකපු දවසට මං ඌව බලාගන්නං .. හොදේ '' ජෙහාන් කී විට ,

'' හා දැක්ක දවසට බලාගන්නකෝ ඔයා '' කියමින් සාරිතා ගෙට ගියාය .

'' තාත්තේ කතාකරනවද ? '' ජෙහාන් යළිත් ඇසුවේය .

'' හ්ම් බලමු . '' බුලත් කෙළ විසි කර ඔහු කීවේය .

'' මොනා බලන්නද තාත්තේ , යන්නකෝ '' ෂෙහාන් ඇවිටිලි කළේය .

'' මේ මොකද්ද උබ අර නංගීගේ පටලැවිල්ලක් ගැන කිව්වේ '' තාත්තා ඇසීය .

'' ඒක මං බලාගන්නං , ඔයා ගිහින් මුලින්ම මගේ වැඩේ කරලා ඉන්න '' කියා ෂෙහාන් ගෙට ගියේය .

'' සිරිල් ... සිරිල් '' පුහුණුකරු නැවති සිටින ගෙදර දොර ළගට පැමිණ ග්‍රාමසේවක කෑ ගසන්නට විය .

සිරිල් පැමිණ දොර විවෘත කළේය .

'' ආ , ආයුබෝවන්ඩ මේ අපේ ග්‍රාමසේවක මහත්තයනේ ... එන්න ඇතුලට '' කියා සිරිල් පුටුවක් පිළිගැන්වුයේය .

පුටුවේ අසුන් ගත් ග්‍රාමසේවක ,

'' අර ස්කොලේ මහත්තයා මෙහෙ නේද නැවතිලා ඉන්නේ ?'' සිරිල්ගෙන් ඇසීය

'' ඔව් , ඒ මහත්තයා මෙහෙ තමයි ඉන්නේ , කතාකරන්නද මහත්තයට ? '' සිරිල් ඇසුවේය .

'' ඔව් කතාකරන්න '' ෂෙහාන්ගේ පියා පිළිතුරු දුන්නේය .

සිරිල් ගොස් කෝච් සරි කැදවාගෙන ආවේය . කෝච් සරි පුටුවකින් අසුන් ගත්තේය .

'' ආ සර් , මම ජෙහාන්ගේ තාත්තා '' කෝච් සර් දුටු විගසම ජෙහාන්ගේ තාත්තා කීවේය .

'' පාසල් වැඩක් නං , පාසල් වෙලාවේ මුණගැහුණා නං නේද හොද ? '' කෝච් සර් කීවේය .

'' පාසල් වැඩක් මත් නෙමෙයි.. ඒත් පාසලට ආදාළයි . මම මේ ගමේ ග්‍රාමසේවකනේ . වැඩ ගොඩයි . ඉතින් , වෙලාවක් ලැබුණු හැටියෙමයි මේ ආවේ '' ඔහු පිළිතුරු දුන්නේය .

'' හරි . මොකද්ද කාරණේ '' කෝච් සර් ඇසීය .

'' කොල්ලා , ටීම් එකේ ඉන්නවනේ.. නායකයට හොදට ගැළපෙනවා . ඒකා දස්සයා . '' ග්‍රාමසේවක කීවේය .

'' මං දැං මාස හයක් එයාලා එක්ක හිටියා.. දැං මං එයාලගේ දක්ෂතා හොදට අදුරනවා . ඔබතුමා මට ඒ ගැන පැහැදිලි කරන්න අවශ්‍ය නෑ '' කෝච් සර් කීවේ සිනාසෙමින්ය .

'' ආ ඒකනේ , එහෙනං මහත්තයෝ මේක ගන්න . දෙදාහක් තියෙනවා . වුවමනාත් ඇතිනේ පුරව ගන්න . කොල්ලා නායකයට සුදුසුම ගෙනා .. තව මොනවා හරි ඕන වුනොත් මට කියන්න '' කියා ග්‍රාමසේවක ලියුම් කවරයක් දික් කළේය .

'' මහත්තයා එයා දක්ෂ නම් ඉස්සරහට එයි . මං කවදාවත් අල්ලස් අරගෙනත් නෑ , ගන්නෙත් නෑ . '' කියා කෝච් සර් කාමරයට ගොස් දොර වසා ගත්තේය .

'' ඒ මෝකො මහත්තයා ඒ වුනේ ?'' සිරිල් ග්‍රාමසේවකගෙන් ඇසීය . සිරිල්ටද ගස්සා ග්‍රාමසේවක පිටත් විය .

පසුදා උදෑසන අපි පාසලට රැගෙන ගියේ ක්‍රීකට් බඩු පමණි . ක්‍රීකට් පුහුණුවීමෙන් අනතුරුව කෝච් සර් අපව කැඳවිය .

'' මං ලොකුහාමුදුරුවන් එක්කත් කතා කරලා අපේ කණ්ඩායමේ නායකයව තේරුවා . '' කෝච් සර් එසේ කීවිට ජෙහාන් අසල සිටි උදාර ,

'' කොල්ලෝ පලයන් ඉස්සරහට , තාත්තා ගේම දීලා ඇති තිතටම . '' කියා පැවසීය .

එවිට ජෙහාන් සීනාසෙමින් , තම කමිසයෙන් කොරළය ඉස්සුවේය .

'' සයුර , සයුර තමයි අපේ කණ්ඩායමේ නායකයා . '' මා දෙසට අත දිගු කරමින් කෝච් සර් පැවසීය .

එවිට ජෙහාන් හා ඔහුගේ මිතුරන් තිදෙනා හැර අන් සියල්ලෝම අත්පොළසන් දෙන්නට විය . ජෙහාන් ආවේගයෙන් එතනින් පිටවිය . පසුව උදාර හා දසුන්ද එතනින් පිටවිය .

එහෙනම් දැං කට්ටියම ගෙදර ගිහින් හොදට නිදාගෙන හෙට උදේ හතර වෙද්දි පාසල ළගට එන්න ඕනා . හෙට තමා අපේ පටන් ගැන්ම . එහෙනං දැං යන්න පුලුවන්.... '' කෝච් සර් කීවේය .

අපිද අපේ ක්‍රීඩා භාණ්ඩ තබා ඇති ස්ථානයට ගියෙමු .

'' ඕයි අර බලපන් අර '' කියා චරිත් අපේ බඩු ඇති තැනට අත දිගු කළේය .

අපි වහාම එතනට දිව ගියෙමු .

'' සයුර උබේ බැට් එක... '' තරිඳු බිම බලමින් කීවේය .

මම එකවරම බිම අසුන් ගත්තෙමි . මට මහත් වේදනාවක් දැනුනේය . බැට් එකේ කැබලි සෑම තැනමය . කවුරුන් හෝ එය පොළවේ ගසා කඩා දමා තිබුණි . කැබලි අතට ගත් මට එකවරම කෑ ගැසුනේය . ඒ කෑ ගැසිල්ලට සියලු දෙනා එතනට දිව ආහ .

'' මොකද පුතේ මේ .. '' අසමින් එතනට කෝච් සර් පැමිණියේය .

'' කෝච් සර් , සයුරගේ බැට් එක . '' නෙවින්ද පිළිතුරු දුන්නේය .

'' කවුද , මේ පහත් වැඩේ කළේ .. මොන හේතුවක් මතද ? '' කෝච් සර් රැස්ව සිටි සියල්ලන්ගෙන් ඇසීය .

කිසිවෙක් පිළිතුරු නොදුන්නේය .

'' ෂෙහාන්... '' මම එකවරම ආවේගයෙන් කෑ ගැසුවේය . ඒ අසල වැටී තිබූ ෂෙහාන්ගේ ඔරලෝසුව දැකීම නිසාය . මම එතනින් නැගිට එකවරම ෂෙහාන්ගේ කමිසයෙන් අල්ලා ගත්තේ කෙන්තියෙන් වෙවුලමිනි .

'' උබ නේද මෙහෙම කළේ ආ , උබ නේද ? '' අසමින් මම ෂෙහාන්ට ගැසීමට පටන් ගත්තෙමි .

'' ඔව් මං තමයි කරේ . මමයි මේකේ නායකයා වෙන්න ඕනා උබ නෙමෙයි සයුර '' ෂෙහාන් කීවේය .

මම ෂෙහාන්ට තව තවත් ගැසීමට පටන් ගත්තෙමි . ඔහුගේ නහයෙන් ලේ ගලන්නට විය . එවිට කෝච් සර් මා තදින් අල්ලා ගත්තේය . දසුන් හා උදාර , ෂෙහාන්ව අල්ලා ගත්තේය . මා නවතා ගැනීමට නොහැකි වූ නිසා මගේ මිතුරන්ගෙන් සර් උපකාර ඉල්ලීය . ඔවුන්ද පැමිණ මා අල්ලාගත්තෝය .

'' උබ දන්නවද යකෝ , මගේ අම්මා මේක අරන් දුන්නේ ණය වෙලා '' මම අඩමින් කීවේමි .

'' උදාර අරන් යනවා ෂෙහාන්ව මෙතනින් .. '' කෝච් සර් උදාරට කීවේය .

උදාර ඒ අනුව ෂෙහාන්ව එතනින් රැගෙන ගියේය . දසුන් ද ගියේය .

'' අනිත් අයත් මෙතනින් යන්න .. හෙට උදේම එන්නත් එපැයි '' කියා කෝච් සර් අනිත් අයවද පිට කළේය .

මම මිතුරන්ව තල්ලු කර එතන තිබු කණුවට අත තබ් ඒ මත ඔලුව තබා අඩන්නට විමි .

තරිඳු මා අසලට එන්නට සුදානම් විය . එවිට කෝච් සර් තරිඳුට නවතින ලෙස අතින් සංඥා කළේය . පසුව කෝච් සර් ඔවුන් හා මදක් අහකට ගියේය .

'' මොකද දැං අපි කරන්නේ . '' ජනිත් සර්ගෙන් ඇසීය .

'' ඔව් සර් හෙට මැච් එක '' තරිඳු කීවේය .

'' මං ළගත් ලොකු මුදලක් නෑ දරුවනේ . බැට් එකක් නැතුව හෙට පිට්ටනියට ඇතුල් කරන එකක් නෑ '' සර් කීවේය .

'' සර් මට පුලුවන් මගේ ෆෝන් එක විකුනන්න . '' නෙවින්ද එවිට කීවේය .

දනිඳු නෙවින්දගේ උරහිසට අත තැබීය .

'' ඒත් පුතා , '' සර් යමක් කියන්න හදන විට ,

'' සර් සයුර නිසයි මං අද මෙතන ඉන්නේ.. ඒ නිසා මුකුත් ප්‍රශ්නයක් නෑ . මේක විකුනුවහම අපිට දහදාහක් ගන්න පුලුවන් '' නෙවින්ද කීවේය .

'' සර් මං ළගත් තුන්දාහක් තියෙනවා . මයික් එකක් ගන්න එකතු කරපුවා . '' ජනිත් ද කීවේය .

'' මං ගාවත් දාහක් තියෙනවා . '' චරිත් කීවේය .

'' මටත් තියෙනවා දාහක් '' තරිඳුද සාක්කුවට අත දමමින් කීවේය .

'' මං ළග පන්දාහක් තියෙනවා පුතාලා .. '' සරි පන්දාහක් තරිඳුගේ අතට දුන්නේය .

'' සරි එහෙනං සයුරත් එක්ක මෙතන ඉන්න . අපි ඉක්මනට බැට් එකක් අරන් එන්නං '' ජනිත් කීවේය .

'' හරි ඔයාලා යන්න '' කියා ඔවුන්ව පිටත් කර සරි මගේ අසලට පැමිණියේය .

'' සයුර , පුතා දැං අඩන එක නවත්තන්න .. එන්න අපි අර බංකුවෙන් වාඩිවෙමු '' කියා සරි මා අසල තිබු බංකුවට එක්ක ගියේය .

'' කෝ.. මේ බලන්න කොල්ලෝ.. අඩන එක නවත්තන්න '' සරි මගේ මුහුණ ඔසවමින් කීවේය .

'' සරි ඇත්තටම මට දුකයි . අම්මා තාම මේ වල ණය ගෙවලත් නෑ . මම ආසාවෙන් හිටියේ මගේ පළවෙනි මැච් එකේ ලකුණු මගේ අම්මා අරන් දුන්නු බැට් එකෙන් ගහන්න . '' මම කීවේමි .

'' එහෙම තමයි පුතා ජීවිතේ.. වෙන්න ඕනි කියලා හිතන් ඉන්න විදියට ගොඩක් දේවල් සිද්ද වෙන්නෙ නෑ '' සරි මට කියන විට සාරිතා එතනට පැමිණියාය . මම සාරිතා දෙස බලා යළිත් අනෙක් අත බලා ගත්තෙමි .

'' දුව කවුද.. '' සරි සාරිතාගෙන් ඇසීය .

'' මගේ යාලුවෙක් සරි '' මම පිළිතුරු දුන්නෙමි .

'' එහෙනං ඔය දෙන්නා ඉන්න. මං බොන්න මොනාහරී අරන් එන්නම් '' කියා සරි නැගිට ආපන ශාලාව දෙසට ගියේය .

'' අයියේ , '' මා අසලින් වාඩිවු සාරිතා මට කතා කළාය .

මම ඊට පිළිතුරු නොදුන්නෙමි .

'' අයියා මාත් එක්කත් තරහද ? තරිඳු අයියව මගදී හම්බෙලා මට විස්තරේ කිව්වා . අපේ අයියා නේද කළේ '' සාරිතා ඇසුවාය .

'' අයියේ , අනේ කතා කරන්නකෝ '' ඇය මාගේ අත අල්ලා ඇවිට්ලා කරාය .

'' ඔව් මගේ බැට් එක කඩලා.. තාම අම්මා එකේ සල්ලි ගෙවලා ඉවරත් නෑ නංගී '' මම අඩමින් පිළිතුරු දුන්නෙමි .

'' අනේ ඔයා අඩනවද අයියේ '' සාරිතා මාගේ මුහුණ දෙස බලමින් අසා , මාගේ ඔලුව ඇගේ උරහිස මත තබා ගත්තාය .

මද වේලාවකට පසු ,

'' කෝ දැං ඇති ළමයෝ.. මේ බලන්න'' කියා ඇය මට ලේන්සුව දෙමින් කීවාය .

මම නැගිට එය ගෙන කඳුලු පිසදමා ගත්තෙමි .

'' ආ මේ වතුර ටික බොන්න , '' ඇය මට වතුර බෝතලයද දිගු කරාය .

මම එය රැගෙන වතුර බිව්වෙමි .

'' දැං ජනිත් අයියලා එනවත් ඇති . දැංවත් හිනා වෙන්නකෝ '' ඇය මට කිවාය .

'' මං ඇඩුවේ නෑ . ඇහැට මොකද්ද ගියා එකටයි කදුලු ආවේ '' මම කිවේමි .

'' හා.. අයියා හිතා ගන්න මං ඒක විශ්වාස කළා කියලා '' ඇය සිනා සෙමින් මට කීවාය .

අපි දෙදෙනා මද වෙලාවක් කතා කර සිටියෝය .

අනතුරුව එතනට මගේ මිතුරන් හා සර් පැමිනියේ බැට් එකක් රැගෙනය .

'' සයුර මේක ගන්න '' සර් මට බැට් එක දික් කළේය . මම එය ගන්නට පෙර නෙවියාව වැළඳ ගත්තෙමි . එවිට අනිත් එවුන්ද අපව වැළඳගත්තෝය .

'' මෙහෙම යාලු කමක් මං මීට ඉස්සෙල්ලා දැකලා නෑ දුවේ '' සර් සාරිතා හා කියන්නට විය .

''හ්මි '' කියමින් සාරිතා හිස වැනුවාය .

අනතුරුව මම බැට් එක අතට ගත්තෙමි .

'' සයුර එක සැරයක් ප්‍රැක්ටිස් කරමු පුතා , හුරු කරගන්නත් එපැයි . '' සර් මට කී විට තරිඳු මට පන්දුව එල්ල කරන්නට විය .

අඩහොරාවක් පමණ පුහුණුවිමි කළ පසු අපි පාසලෙන් පිට වුනෙමු . සාරිතා ද අප හා ආවාය .

'' එහෙනං අයියලා හැමෝම හෙට හොදට සෙල්ලම් කරන්න '' කියා සුභ පතමින් ඇය අපෙන් සමුගත්තාය .

අපි නිවෙස් වලට ගියෙමු . රාත්‍රිය ගෙවී ගියේය . වේලාව පාන්දර දෙකට ආසන්න විය . අම්මා පැමිණ මා ඇහැර වුවාය . මම ඉක්මනින් සුදානම් වුනෙමි . පසුව බුදුන් වැඳ සීයාට මා අම්මාට වැන්දෙමි . අනතුරුව තරිඳු ඔහුගේ පියා සමග අපේ නිවසට පැමිණියේය .

'' අම්මා මං යනවා '' කියා මම එළියට බැස්සෙමි .

'' හොදයි , පරිස්සමින් . හොදට සෙල්ලම් කරන්න '' කියා ඇය මට කීවාය .

නමවන පරිච්ඡේදය

අපි දෙදෙනා තරිඳුගේ පියා සමග පාසලට ආවෙමු . එහි සියල්ලෝම විය . සරි පැමිණ මා එක්ක ගියේය .

'' පුතා , ඊයේ වුනු දෙවල් අමතක කරා නේද ? මොකද අද ටීම් එක මෙහෙයවන්නේ ඔයා . මං කියන දේ තේරෙනවා නේද ? '' ඔහු මගෙන් ඇසීය .

මම හිස වනා පිළිතුරු දුන්නෙමි . පසුව අපි බසයට නැගී බණ්ඩාරණායක ක්‍රීඩාගාරය වෙත ගියෙමු .

අපේ ප්‍රතිවාදී පිළ , අශෝක විද්‍යාලයේ පිළ ද එහි විය . ජනිත්ද සරි හා පැමිණියේය . තරගය පටන් ගැනීමට සියල්ල සුදානම්ය . කාසිය වාසිය උරගා බැලීමට මම විනිසුරුකරු අසලට ගියෙමි . අනිත් පිළේ නායකයාට අතට අත දීමෙන් අනතුරුව , කාසිය වාසිය උරගා බැලුවෙමු . වාසිය ඔවුන්ට විය .

නමුත් පළමුව පහර දීමට ඔවුන් අපට ආරාධනා කළෝය . ඒ අනුව අපි පහර දීමට සුදානම් වුනෙමු .

'' ඔව් මේ අවස්ථාවේ , ධර්මානන්ද විද්‍යාලය හා අශෝක විද්‍යාලය අතර ඇරඹෙන්නේ සමස්ථ ලංකා පළමු ක්‍රිකට් තරගයයි . කාසිය වාසිය බැලීමෙන් අනතුරුව ධර්මානන්ද කණ්ඩායම පළමුව පන්දුවට පහර දීමට පිටියට පැමිණෙන ආකාරය අපට දැකගන්න පුලුවන් . පළමුව පිටියට එලඹෙන්නේ සයුර හා තරිඳු යන දෙදෙනායි දැං තරගය ආරම්භ කරනවා . අශෝක පිළේ අකලංක පන්දුව එල්ල කිරීමට සුදානම් වෙනවා . සයුර පහර දීමට සුදානම් . '' සිංහල නිවේදක නිවේදනය කිරීමෙන් අනතුරුව ඉංග්‍රීසි නිවේදකද නිවේදනය කරන්නට විය .

'' අකලංක දුව විත් පන්දුව එල්ල කරනවා . ඔව් මේ අවස්ථාවේ සයුර ප්‍රථම හතර වාරථා කරනවා . ඉතා හොඳ ආරම්භයක් තම කණ්ඩායමට ලබා දීමට සයුරට හැකි වෙනවා ... '' මෙලේස ඔවුන් නිවේදනය කරන්නට විය .

සියල්ලම දැවී අපි ලකුණු එකසිය දොළහක් ලබා ගත්තෙමු . පසුව අනිත් පිළට අවස්ථාව උදා විය . ඒ අනුව තියුණු තරගයකට පසු සියල්ලන්ම දැවී ඔවුන්ට රැස් කර ගත හැටක් වුයේ ලකුණු හැටක් පමණි . එමනිසා ලකුණු හැත්තෑ දෙකක ජයක් අපට හිමි විය .

එයින් අනතුරුව අපි පාසල බලා පිටත් වුනෙමු . මෙලේස තරග කිහිපයක් ජයගෙන අපි අවසන් පුර්ව තරගයට පැමිනියේමු .

'' පුතාලා , හෙට තමයි දවස.. අපි හෙට දිනන්නම ඕනා . '' කෝච් සර් අපව කැඳවා කීවේය .

අනතුරුව අපි නිවසට ගියෙමු . හෙට දින උදාවන්නේ අපේ ක්‍රීකට් දිවියේ වැදගත් දිනයකි .

අපි උදෑසනම ක්‍රීඩාගාරය වෙත ගියෙමු . තරගය ආරම්භ කිරීමට සියල්ල සුදානම්ය . අප පාසලේ පිරිස්ද අනෙක් පාසලේ පිරිස්ද ක්‍රීඩාගාරයේ විය . පොඩිහාමුදුරුවන් හා අම්මාද , තරිදුගේ අම්මාද එහි විය . කෝච් සර් අපට උපදෙස් දී හාමුදුරුවන් අසලට යාමට සුදානම් වුවත් , එවිට තරගය ආරම්භ කිරීම නිසා ඔහුට යා නොහැකි විය .

තරගය ඇත්තේ නාලන්දා විද්‍යාලය හා අප අතරය . කාසියේ වාසිය නාලන්දා විද්‍යාලයට ලැබීම නිසා ඔවුන් ප්‍රථමයෙන් පන්දුවට පහර දුන්නෝය .

පන්දුවාර සියල්ල අවසානයේ කඩුලු තුනක් ඉතිරිව තිබියදී ඔවුන් එකසිය අනුඑකක් රැස් කලෝය .

ඉලක්කය නම් විශාලය . නමුත් දැං පරාජය ලැබීය නොහැකිය . වෙනදා මෙන්ම මම හා තරිඳු පළමුව පහර දීමට පිටියට ගියෙමු . අවසාන පන්දුවාරයේදි අපට ලකුණු තිස් හතක් අවශ්‍යව තිබුණි . ඉතිරි වුයේ මා හා දසුන් පමණි . පන්දුවාරයකට ඇත්තේ පන්දු හයක් පමණි . ලකුණු හයේ හයක් ගැසුවත් අපට දිනීමට අවස්ථාවක් නැත .

'' අවසන් පන්දුවාරය , ධර්මානන්ද පිළට තව ලකුණු තිස් හතක් ජයග්‍රහණයට අවශ්‍යව ඇත . නාලන්දා පිළ නම් බොහෝ සතුටින් පසුවන ආකාරයක් අපට දැක ගත හැක . අවසන් පන්දු වාරය දැන් ඇරඹුණා . '' නිවේදක නිවේදනය කරන්නට විය .

පන්දුවට පහර දීමට සිටියේ දසුන්ය . මුලු ක්‍රීඩාගාරයම නිශ්ශබ්දය . ඔවුන් පන්දුව එල්ල කරන්නට විය . දසුන් ඊට පහර දී එකක් දමා මට අවස්ථාව දුන්නේය . දිව යන අතරතුර ,

'' සයුරයා , නෙළන්න තමා තියෙන්නේ '' කියමින් ඔහු දුවන්නට විය .

තව ඉතිරිව ඇත්තේ පන්දු පහක් පමණි . නමුත් ලකුණු තිස් හයක් අවැසිය . මම පහර දීමට සූදානම් වුනෙමි .

'' පන්දු පහකට ලකුණු තිස් හයක ඉලක්කයක් . තරගය ඉතා උණුසුම් . ඔව් දැන් දෙවන පන්දුව එල්ල කරනවා... පන්දුව හයේ සීමාව පසු කරනවා... ඔව් ලකුණු හයක් . ඒ අනුව ජයග්‍රහණයට තව ලකුණු තිහක් අවශ්‍යයි . ඉතිරිව ඇත්තේ අවසාන පන්දු හතරයි . '' නිවේදක කියන්නට විය .

'' තුන්වන පන්දුව එල්ල කරනවා... ඔව් එයත් හයේ සීමාව පසු කරනවා . තරගය නම් ඉතාමත් උණුසුම් . ඒ අනුව ප්‍රයග්‍රහණයට තව ලකුණු විසිහතරක් අවශ්‍යය . තව පන්දු තුනක් පමණයි ඇත්තෙ.. නැවතත් පන්දුව එල්ල කරනවා . අවාසනාවන්ත ලෙස එය නිදැල්ලේ යනවා . නමුත් විනිසුරුකරු සංඥාවක් නිකුත් කරනවා . ඒ අනුව එය වයිඩ් පන්දුවක් ලෙස නම්කරනවා . ඒ අනුව එය පන්දුවක් ලෙස සලකන්නේ නැති අතර ධර්මානන්ද පිළට ලකුණක් හිමිවනවා . තව පන්දු තුනකට ලකුණු විසි තුනක් ලබා ගත යුතුය .

පන්දුකරු හතරවන පන්දුව නැවතත් එල්ල කරනවා . ඔව් මේ අවස්ථාවේ එය හයේ සීමාව පසු කරනවා . ඒ අනුව ලකුණු එකසිය හෑත්තෑහතරක් ලබා ගන්නවා . තව ඉතිරිව ඇත්තේ පන්දු දෙකක් පමණි . ලකුණු දහහතක් අවශ්‍යව ඇත . පස්වන පන්දුව එල්ල කිරීමට සූදානම් . පන්දුව එල්ල කරනවා . එයත් හයේ පහරක් . ඒ අනුව ප්‍රයග්‍රහණයට ඇත්තේ ලකුණු එකොළහකි . දැං අවසාන පන්දුව එල්ල කිරීමට ක්‍රීඩකයා සූදානම් . '' නිවේදක කීවේය .

කෝච් සර් දෙස මම බැලුවේමි . ඔහු මුහුණට අතගසා ගෙන සිටියේය . . ඇත්තේ අවසාන පන්දුවයි . මම ඊට සූදානම් වුනෙමි . අනෙක් පිළේ අය දැන්ම ඔවුන්ගේ ප්‍රයග්‍රහණය සැමරීමට සූදානම් විය .

'' අවසාන පන්දුව එල්ල කිරීමට ක්‍රීඩකයා දිව එනවා . ඔව් එය හයේ පහරක් ඒ සමගම විනිසුරුකරු එය නෝබෝල් එකක් ලෙස නම් කරනවා . එනම් පන්දුව එල්ල කර ඇත්තේ සීමාවෙන් පිටට පාදය තබාය . ඒ අනුව එය පන්දුවක් ලෙස නොසලකන අතර ලකුණු හය ලබා දෙනවා . තරගය ඉතා උණුසුම් . එය ප්‍රේක්ෂකාගාරයෙන් ඔබට ඇසෙන ඝෝෂාවට අනුව තීරණය කිරීමට හැකිය . නාලන්දා පිළ දැන්නම් බියවී ඇති අන්දම ඔබට පෙනී යනවා . තව පන්දුවක් ඇත . තරගය සම කිරීමට ලකුණු හතරක් අවශ්‍ය වේ . නමුත් මෙතෙක් සයුර දැක්වූ ප්‍රතිචාර අනුව තරගය ජයග්‍රහණයටද අවස්ථාව ඇත . එසේනම් අවසාන පන්දුව . ලකුණු පහක් ලබා ගත යුතුයි . '' නිවේදක නිවේදනය කළේය .

මම යළිත් කෝච් සර් දෙස බැලුවෙමි . ඔහුගේ ඇස් වල මහත් විශ්වාසයක් තිබුණි . ජබ්බාද මට සූභ පැතුවේය . පන්දුව එවීමට පන්දුකරු සූදානම්ය . මමද සූදානම් විය .

'' දැං අවසාන පන්දුව යොමුකරනවා . සයුර පන්දුවට පහර දෙයි . ඔහු ඒ සමගම දිව යන්නට විය . පන්දුව වේගයෙන් හතරේ සීමාව වෙත ඇදෙන්නට විය . නාලන්දා ක්‍රීඩකයෙක් එය අල්ලා ගැනීමට දිව යයි . නමුත් පන්දුව හතරේ සීමාව පසුකරයි..... එවිට ලකුණු හතරක් හා දුව ලබාගත් ලකුණද සමග ලකුණු පහක් ලබා ගෙන නොසිතූ ආකාරයට ධර්මානන්ද පිළ ජය ලබා අවසන් මහා තරගයට සුදුසුකම් ලබනවා '' නිවේදක නිවේදනය කළේය .

එවිට අපේ පිළේ සියලු දෙනා පිටියට පැන අවෝය . දසුන් විකට් පොල්ලක්ද ගෙන නටන්නට විය . තරිඳු හා නෙවින්ද මා එසවුයේය .

තරගයේ වීරයාට හිමි සම්මානය මට ලැබුණි . මම එයද රැගෙන අම්මා අසලට ගියෙමි . අම්මා හා කෝච් සර් මුහුණට මුහුණ බලාගෙන සිටින්නට විය .

'' ජගත් ඔයා ? '' අම්මා එසේ කියද්දී ඇගේ ඇස් වලින් කඳුලු ගලා ආවාය .

මම අම්මා අසලට ගොස් ,
'' ඇයි අම්මේ මොකද වුනේ ? '' කියා ඇසුවෙමි . එවිට
කෝච් සර් මා දෙසද බැලුවේය .

එතනට කණ්ඩායමේ සියල්ලම හා පොඩි හාමුදුරුවන්ද ආවේය .

'' පුතා.. තාත්තා.. '' කියා ඇය සර් දෙසට අත දිගු කළේය .

මට කීරිමට දෙයක් සිතා ගත හැකි නොවීය . සර් පැමිණ මා වැළඳ ගත්තේය . එවිට අම්මා අප දෙදෙනාම වැළඳ ගත්තාය .

කාලය ගෙවී යන්නට විය . අපි තිදෙනා ගෙදර ගියෙමු .

'' තාත්තේ මේ බලන්න කවුද ඇවිත් , '' අම්මා සීයාට කාමරයේ දොර ළඟට ගොස් කිවාය .

නමුත් සීයා නොපැමිණියේය . එවිට අපි කාමරයට ගියෙමු . සීයා සිහි නැතිව බිම වැටී සිටියේය . තාත්තා සීයාව නැගිටවීය . අපි වහාම සීයාව රෝහලට ඇතුලු කළේය . නමුත් වෛද්‍යවරුන් පැවසුවේ හෘදයාබාධයක් නිසා සීයා බේරා ගත නොහැකි බවයි .

අම්මා අඩන්නට පටන් ගත්තාය . තාත්තා අම්මාව සැනසුවේය . සීයාට සිහිය පැමිණ ඇති නිසා අපට ගොස් ඔහුව බලන්නට කීවේය . අපි වහාම එතනට ගියෙමු . සීයා දෑස් හැර අප දෙස බැලුවේය .

තාත්තාව දුටු ඔහු සීනාසී ,
'' මං දැනන් හිටියා උබ ඒයි කියලා . එතකන් මං මේ දෙන්නව බලා ගත්තා . දැං උබ බලාගන්නට ඕනා ප්ගත් '' කියා කීවේය

'' කොල්ලෝ අම්මවයි තාත්තවයි බලාගනින් '' කියා සීයා මට කීවේය .

'' ඔන්න ඇවිත් ඉන්නවනේ . දැං ආයේ හූල්ලන්න දෙයක් නෑ '' සීයා අම්මාට කීවේය .

'' මගේ කාලේ ඉවරයි . දැං මං යනවා උබලෑ ආච්චි ළගට '' සීයා මට කීවේය . එවිටම සීයා දෑස් පියා ගත්තේය . අම්මා හඬන්නට විය .

සීයාගේ හත්දවස අහවර විය . මගේ මිතුරන් දවස් හතම අපේ ගෙදරය . පසුව දාට පසුව දා මා හා තාත්තා පාසල් යන්නට එළියට බැස්සෙමු . එවිට තරිදුද ආවේය .

අපි පාසල් ගියෙමු . හවස පුහුණුවිම් අතරතුර අනිද්දා අවසන් තරගය බව කෝච් සර් අපට කීවේය . අපි ඊට හැකි තාක් පුහුණු වුනෙමු . දිනය උදා විය .

අපි හාමුදුරුවන්ගෙන් ආශිර්වාද ගෙන සුගතදාස ක්‍රීඩාංගනයට ගියෙමු . අම්මාද සාරිතාද අප හා ආවෝය .

දහවන පරිච්ඡේදය

අද තරගය ඇත්තේ කොළඹ රාජකීය සමගය . ඔවුන් අපට පෙර පැමිණ පුහුණුවන්නට විය . අපිද පසුව පුහුණුවන්නට විය . වේලාව අට පමණ විය . තරගය පටන් ගැනීමට සුදානම් විය . මම හා රාජකීය නායකයා අතට අත දී කාසිය වාසියට සුදානම් වුනෙමි .

'' සමස්ථ ලංකා මහ ක්‍රිකට් තරගයේ අවසන් මහා තරගය කොළඹ රාජකීය හා වැල්ලම්ටිය ධර්මානන්දය අතරයි . දැන් විනිසුරුවරුන් හා නායකයින් දෙදෙනා පැමිණ කාසියේ වාසිය උරගා බැලිමට සුදානම් වේ . කාසියේ වාසිය හිමිවන්නේ ධර්මානන්දයටයි . ඒ අනුව මුලින්ම ඔවුන් පහර දීමට සුදානම් වෙනවා . ධර්මානන්ද නායක සයුර හා තරිඳු පළමුව පිටියට පැමිණෙනවා . සයුර , මෙවර තරගාවලියේ වැඩිම ලකුණු සංඛ්‍යාවට හිමිකම් කියු ක්‍රීඩකයා . දැන් තරගය ආරම්භ වනවා . '' නිවේදක කීවේය .

කාලය ගත වන්නට විය .

'' ධර්මානන්දයේ සියලු දෙනා දැවී ලකුණු එකසිය අසුවක් රැස් කළේය . ඒ අනුව රාජකීයන්ට ඉලක්කය ලකුණු එකසිය අසුඑකක් වනවා . ධර්මානන්ද පිළේ ෂෙහාන් පළමුව පන්දු යොමු කිරීමටයි සූදානම් . '' නිවේදනය කරන්නට විය .

ඔවුන් අපි සිතුවාට වඩා බෙහෙවින් වෙනස් අයුරකින් ක්‍රීඩා කරන්නට විය . අපි අවසාන පන්දුවාරය වන විට ඔවුන්ගෙන් හයදෙනෙකු දවා ගෙන තිබුණත් ඔවුන්ට ජයග්‍රහණයට ඉතිරිව තිබුනේ පන්දු හයකට ලකුණු තුනක් පමණි .

'' රාජකීය පිළට තව ඉතිරිව ඇත්තේ ලකුණු තුනක් පමණි . ඔවුන්ට නිසැක ජය හිමි වන බව නොඅනුමානයි . '' එක් නිවේදකයෙක් කීවේය .

එවිට අනිත් නිවේදකයා , '' එසේ කීව නොහැකි . මන්ද යත් ධර්මානන්දය පෙර තරග වලදී මීට පෙර කිසිවෙක් නොදැක්වූ දක්ෂතා පෑ අයුරු අප සැමට මතකයි . '' කීවේය .

'' නමුත් මීට පෙර අවුරුදු පහක් පිට පිටම මේ තරගාවලියේ ශූරතාව දිනා ඇත්තේ රාජකීයන්ට විසින් . අදත් එය නො අනුමානයි . '' පෙර නිවේදකයා කීවේය .

'' නමුත් පෙර පුහුණුකරු දැන් ධර්මානන්දයේ සේවය කරන්නේ ,'' මෙලෙස ඔවුන් දෙදෙනා වාද කරන්නට විය .

'' අන්තිම ඔවර් එකට කාවද දාන්නේ . ලකුණු තුනයි තියෙන්නෙ . පාස්ට් බොලර් ගෙනෙක් වෙන්නත් බෑ . ස්ලෝ

වෙන්නත් බෑ . උදාර , ඔව් එයා තමයි හරියන්නේ . '' මම කල්පනා කළෙමි .

පසුව මම බෝලය රැගෙන ඔහු වෙත ගියෙමි .

'' උදාර ල බෝල් කරන්න ග '' මම කීවේමි .

'' මම . ඒත් සයුර , '' උදාර අදිමදි කළේය .

'' මට විශ්වාසයි , ඔයා දාන්න '' කියා මම කීවේමි .

'' මේ අවස්ථාවේ ධර්මානන්ද පිලේ උදාර පන්දුව එල්ල කිරීමට සූදානම් වන බව අපට දැකගන්න පුලුවන් . ඔව් දැන් පන්දුව එල්ල කරනවා . ඒ පන්දුවට එක ලකුණක් ලබා ගන්නවා . ධර්මානන්ද ක්‍රීඩකයන් මදක් බියවී ඇති බව අපට පෙනී යනවා . දෙවන පන්දුව එල්ල කරනවා . තවත් ලකුණක් ලබා ගැනීමට ඔවුන්ට හැකි වෙනවා . තව අවශ්‍යව ඇත්තේ ලකුණු එකක් පමණි . දැං දෙපිළම සමාන තත්වයේ පසු වනවා . '' නිවේදක කියන්නට විය .

උදාර මා දෙස බැලුවේය . මම නොබියව සිටින ලෙස අතින් සංඥා කළෙමි .

'' නැවතත් පන්දුව එල්ල කරනවා . ඔව් මේ අවස්ථාවේ උඩ පන්දුව රැක ගැනීමට නෙවින්ද සමත් වනවා . ඒ අනුව රාජකීය නායකයා දෑවී යනවා . '' නිවේදක කියන්නට විය .

අපි සැම දෙනාම නෙවින්දව වැළඳ ගත්තෙමු . පසුව උදාරවද වැළඳ ගත්තෙමු .

'' තව විකට තුනයි තියෙන්නේ , අපිට දිනන්නම වෙනවා '' කියා මම ඔහුගේ පිටට තට්ටු කළෙමි .

ඔහු හිස වැනුවේය .

'' දැං පිටියට එන්නේ රාජකීය පිලේ මලිත . දැං උදාර පන්දුව එල්ල කරනවා . ඔව් පන්දුව නිදැල්ලේ යනවා.. දැන්නම් තරගය උණුසුම් . තව ඇත්තේ පන්දු දෙකක් පමණි . ජයග්‍රහණයට තව ඉතිරිව ඇත්තේ ලකුණක් පමණි . උදාර නැවත පන්දුව එල්ල කරනවා . කඩුල්ල දෙකඩ කරමින් පන්දුව යොමු වෙනවා . මලිත දෑවී යනවා ඒ අනුව ක්‍රීඩක මහෙෂ් පිටියට පැමිණෙනවා . ජය ගැනීමට නං මේ පන්දුවට අනිවාර්යයෙන් ලකුණක් ලබා ගත යුතුමය . උදාර නැවත පන්දුව එල්ල කරනවා . මහෙෂ් පන්දුවට පහර දී දිව යනවා . නමුත් ලකුණු රැස් කිරීමට හැකියාවක් නෑ . මොකද ෂෙහාන් පන්දුව ගෙන විකට්ටුවට දමා ගසනවා . ඒ අනුව ලකුණකට අවස්ථාව හිමි වන්නේ නෑ . ඒ අනුව තරගය සම වනවා . සුපිරි ඉනිමකටයි මේ අවස්ථාව . ඒ අනුව මද විරාමයකට පසු දෙපිළටම තව එක් ඉනිමක් අවසාන ලෙස ලැබෙනවා ග එසේනම් මද විරාමයකට අනතුරුව සුපිරි ඉනිමක් සමග මුණ ගැසෙමු '' යනුවෙන් නිවේදනය කරන්නට විය .

අපි පිටියෙන් ඉවත් වුනෙමු . පසුව කෝච් සර් හා කතා කළෙමු .

'' සයුර මොකක්ද සුපර් ඕවර් එකට ප්ලෑන් එක ? '' කෝච් සර් මගෙන් විමසුවේය .

'' සර් . බෝල් කරන්නේ උදාරමයි මොකද එයාගේ බෝල් එකට එකක් වෙනස් '' මම කීවේමි .

'' එතකොට බැට් කරන්නේ මුලින්ම . ඔයයි තරිදුයි ද ?'' යළිත් කෝච් සර් මගෙන් විමසුවේය .

'' කෝ මේකේ අනිත් පිටුව ? '' දෙනෙත් තමාගෙන්ම ප්‍රශ්න කළේය .

මන්ද යත් පොත එතනින් අවසානය .

'' අයියෝ කවුද බැට් කරේ . එයාලා දිනුවද '' දෙනෙත්ගේ සිතේ ප්‍රශ්න කෝටියකි . එවිට සාරිතා දොර අසලට පැමිණ ,

'' මොකක්ද පුතේ ඔය හැට් කියවන පොත '' කියා ඇසුවාය .

'' අනේ අම්මේ මෙහෙ එන්නකෝ ඉක්මනට '' දෙනෙත් සාරිතාට අඩගැසුවේය .

සාරිතා කාමරයට ආවාය . දෙනෙත් තම ඇදෙන් සාරිතා වාඩි කර ගත්තේය .

'' අම්මේ එදා රාජකීයත් එක්ක තිබ්බ අන්තිම තරගේ සුපර් ඕවර් එකට මොකද වුනේ , අවසාන ඉනිමට සෙල්ලම් කළේ කවුද ? '' දෙනෙත් ඇසුවේය .

'' ඔයා තාත්තිගේ දිනපොතද මේ කියෙව්වේ ? '' සාරිතා ඇසුවාය .

දෙනෙත් හිස වනා පිළිතුරු දුන්නේය .

'' එදා , සරි අහද්දි කවුද බැට් කරන්නේ කියලා ඔයාගේ , තාත්තා එයා කිවුවා බැට් කරන්නේ , එයයි ඔයාගේ මාමයි කියලා . '' සාරිතා කීවාය .

'' ජෙහාන් මාමාද ? '' දෙනෙත් ඇසීය .

'' ඔව් , අන්තිමට ලකුණු තිහක් ඕනා උනා , එ දෙන්නා එක ගහලා මැච් එක දින්නා . එදා තමයි ඔයාගේ මාමා තාත්තා එක්ක යාලු වුනේ . මාමට තරගයේ වීරයා සම්මානය හම්බුණා .
තාත්තට තරගාවලියේ වීරයා සම්මානය හම්බුණා . මාමාගේ යාලුවට හොදම පන්දුයවන්නට හිමි සම්මානය ලැබුණා . '' සාරිතා කියා ගෙන යන විට කාරයක් පැමිණ ගෙට්ටුව අසල හෝන් ගසන්නට විය .

ජනේලයෙන් ඒදෙස බැලු සාරිතා ,
'' අන්න තාත්තා ඇවිත් '' කියා කියන විටම දෙනෙත් දිව ගියේ දිනපොතද රැගෙනය .

සයුර ගෙට ඇතුලු වන විටම දෙනෙත් , '' ආ පේලේ , ලීග් ක්‍රීකට් තරගේ නතර කළා නේ .. '' කියා ඇසුවේය .

'' පේලේ... '' සයුර සිනාසෙමින් ඇසුවේය .

දෙනෙත් තම අතෙහි වු දිනපොත පෙන්විය . සයුර දෙනෙත්ගේ හිස අතගා ගෙදරට ඇතුලු විය .

-නිමි-